තාක්ෂණික ආයතනය
මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව
හා
වාර්ෂික ගිණුම්

2017

2018.06.21 දින පැවති 208 වෙනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී.

දැක්ම

තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

මෙහෙවර ප්‍රකාශය

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණික ආයතනයක් බවට පත්කිරීම මෙන්ම ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදීම.

- *සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ලගාවිය හැකි, නම්‍යතාවයෙන් යුතු කාර්යක්ෂම තාක්ෂණික අධ්‍යාපනයක් සහ පුහුණුව ලබාදීම.*
- *නව්‍යකරණ සහ නිර්මාණශීලී පරිසරයක් ගොඩනැගීම.*
- *වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමග ක්‍රියාශීලි සංවාදයක් ඇතිකිරීම.*
- *තරුණයින්හට සමාජයීය ආර්ථික මාර්ගයන් සඳහා විවෘත වන අවස්ථාවන් පුළුල් කිරීම.*

පටුන

පිටු අංකය

	දැක්ම	i
	මෙහෙවර	i
01.	හැඳින්වීම	1
02.	තාක්ෂණික ආයතනයේ අරමුණු	4
03.	ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ කෙටි ඉතිහාසය සහ මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය ස්ථාපිත කිරීම	5
04.	මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය නව ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	
	4.1 2017 අවසානය දක්වා ව්‍යාපෘතියේ ප්‍රගතිය (සාමාන්‍ය ලෙස)	8
	4.2 ව්‍යාපෘතියට අදාල සමාලෝචිත වර්ෂය තුල ලබා ගත් සැලකිය යුතු ජයග්‍රහණ	9
05.	ආයතන පරිශ්‍රය	10
06.	ආයතනයේ කළමණාකරන මණ්ඩලය	13
07.	ආයතනයේ නිළධාරීන්	14
	7.1 සංවිධාන සැලැස්ම - 2017	15
08.	කාර්යය මණ්ඩලය සහ සිසුන් පිළිබඳ විස්තර	16
	8.1 දේශීය සිසුන් පිළිබඳ විස්තර	17
	8.2 අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩල පිළිබඳ විස්තර	18
09.	පර්යේෂණ, නව නිමැවුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	19
10.	වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	22
11.	ලැබූ ප්‍රදානයන් පිළිබඳ විස්තර	23
12.	පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	24
13.	ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	24
14.	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදලින්)	24
15.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරය (වැය)	25
16.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරය (උපයන ලද ආදායම)	25
17.	මූල්‍ය ක්‍රියාකාරීත්වය සමාලෝචනය - 2017	25
18.	වෙනත් විස්තර	25
19.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	26
20.	මූල්‍ය ප්‍රකාශයන් පිළිබද සටහන්	30
21.	විගණන කමිටු වාර්තාව	35
22.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	36
23.	විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු	44
24.	ඇමුණුම්	50

01. හැඳින්වීම

(අ) කෙටි හැඳින්වීම



ජාතික හා ජාත්‍යන්තරික වශයෙන් මැනවින් පිළිගත් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා අධ්‍යයන වැඩ සටහන (NDT) ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු ප්‍රමුඛ පෙළේ ආයතනයකි මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය.

මොරටුව විශ්වවිද්‍යාලය සතු පහසුකම් බෙදා ගනිමින් මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය 2017 වර්ෂයේ උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදි. 2017 ජනවාරි මස සිසුන් සඳහා වූ නම්නීකරන වැඩ සටහන සහ කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු සිසුන් 1050 ක් විෂයධාරා නමයක් (09) එනම් රසායනික, සිවිල්, විදුලිය, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, නාවික, නාවුක, පොලිමර් සහ රෙදිපිළි යටතේ ආයතනය තුල අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදි.

(ආ) ජයග්‍රහණ

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය, හෝමාගම දියගම නව ස්ථානයේ 2017 මැයි මස ස්ථාපිත වූ අතර, එහි නව ගොඩනැගිලි සංකීර්නය, දේශන ශාලා, රසායනාගාර, කාර්යාල ඉඩ පහසුකම්, ශිෂ්‍ය නේවාසිකාගාර, කාර්යාල මණ්ඩල පහසුකම්, ආගන්තුක නිවාසය, විවිධ කාර්යයන් සඳහා වූ ශාලාව, භාණ්ඩ මිල දී ගැනීමේ මධ්‍යස්ථානය ද විය.

නැවත ස්ථාපිත කිරීමෙන් පසු ලබා ගත් ජයග්‍රහණ,

- මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් 2018 වර්ෂය සඳහා ලැබී ඇති අයදුම්පත් 2786 පරීක්ෂා කර බලා වර්ෂය අවසානයේ දී නවක සිසුන් 480 ලියාපදිංචි කර ඇත.(මෙය 40% ක වැඩි වීමකි)
- උපාධි ප්‍රධානෝත්සවය නියමිත පරිදි 2017/10/24 දින පවත්වන ලදි.
- පළමු වසරේ විෂය මාලාව උසස් කොට වාර දෙකක් ලෙස සලකා නවක ශිෂ්‍ය කණ්ඩායමට 2018 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ය.
- සෞන්දර්යය අධ්‍යයනය සහ ක්‍රීඩා අධ්‍යයනය නම් වූ නව අධ්‍යයන ඒකක දෙකක් මානව ශාස්ත්‍ර ස්වභාවය යටතේ විෂය මාලාවට එකතු කරන ලදි.
- අලුතෙන් සකස් කරන ලද ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව සහ වාර්ෂිකව ගෙවිය යුතු රු.5000/= ගෙවීමෙන් අනතුරුව සියළු ම එන්.ඩී.ටී. පළමු වසර සහ දෙවන වසර සිසුන් නේවාසිකාගාර පහසුකම් සඳහා ලියා පදිංචි කරන ලදි.
- වෛද්‍ය මධ්‍යස්ථානය පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා වෛද්‍යවරුන් දෙදෙනෙක්, හෙදියක් සහ සෞඛ්‍ය සේවා උපස්ථායකයෙක් බැහැරින් ලබාගෙන ඇත.රාත්‍රී කාල හදිසි සේවය සඳහා අවශ්‍ය වූ විටෙක සේවය ලබා ගැනීමට ක්‍රියාත්මක කර ඇත.
- කාර්ය මණ්ඩලය සහ සිසුන්ගේ පරිහරණය සඳහා භෝජන ශාලා දෙක ම ක්‍රියාත්මක කරන ලදි.
- වර්ෂයේ අග භාගයේ දී සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාලය විවෘත කරන ලදි.මෙම ක්‍රියාවට සහයෝගය දැක්වීම සඳහා වැඩ බලන සහකාර පුස්තකාලයාධිපති වශයෙන් වැඩ පැවරුම් පදනම මත ලබාගෙන ඇත.
- අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 47 ක්, අභ්‍යන්තර මාරු වීම්, උසස් වීම් සහ බාහිර වශයෙන් අයදුම්පත් කැඳවීමෙන් පුරවන ලදි.
- මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී යන දෙදෙනා ම තමන් ඉල්ලුම් කරන ලද මාරු වීම් ලබා ගත් අතර නව නියෝජ්‍ය ලේඛකාධිකාරවරයා අගෝස්තු මස වැඩ භාර ගන්නා ලදි.
- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරු දෙක විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලත් නිළධාරීන්ගෙන් බාහිර පදනම මත පුරවා ගන්නා ලදි.නව නියෝජ්‍ය ලේඛකාධිකාරී සංක්‍රාන්තික කාල සීමාව තුල මේ අයගේ පළපුරුද්දෙන් ලත් අත්දැකීම් ලබා ගන්නා ලදි.

(ඇ) අපොහොසත්වීම් සහ සාධාරණීයකරණය

අධ්‍යයන වාරයක් තුල කාර්ය මණ්ඩලයත් ශිෂ්‍යයනුත් ඇතුලුව ආයතනය නැවත ස්ථානගත කිරීම අපහසුතාවයන් මුසු වූ කාර්යයක් වූ අතර එයට අනුකූලව සහ නව පරිසරයට අනුගතව අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමේ දී ප්‍රමාදයන් ඇති විය.එහෙත් 2017 වර්ෂය අවසාන වන විට මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය සියලු අධ්‍යයන කටයුතු අවසන් කොට වර්ෂ අවසානයේ විභාග කටයුතු කිරීමට ද හැකි විය. එන්.ඩී.ටී. දෙවන වසර අවසාන පරීක්ෂණය 2018 ජනවාරි මස මැද භාගයේ දී පවත්වන ලදි.සිසුන් තමන්ගේ තුන්වන වසර කාර්මික පුහුණුව, ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු කිරීමේ ආයතනය විසින් නියම කරන ලද දිනයන්හි දී පැවැත්වීමට හැකි විය.

(ඉ) අනාගත සැලසුම්

නව ගොඩනැගිලි සංකීර්ණය ඉදි කරනු ලැබුවේ සිසුන් 1000 ක් පමණ ඇතුලත් ගැනීමේ අපේක්ෂාවෙනි.එනිසා දැනට ඇතුලත් කර ගනු ලබන ප්‍රමාණය ක්‍රමක්‍රමයෙන් වැඩි කරනු ඇත.

එන්.ඩී.ටී. වැඩසටහනට නව විෂය ධාරාවන් ඇතුලත් කරනු ඇත.එය 2019 වර්ෂයේ දී තොරතුරු තාක්ෂණය විෂයයෙන් ආරම්භ වනු ඇත.

අධ්‍යයන අංශ, පශ්චාත් ඩිප්ලෝමා වැඩ සටහන් ඉදිරිපත් කරමින් කර්මාන්තයන් හි අවශ්‍යතා ඉටු කොට ස්වකීය ජාතික වගකීම පුළුල් කරනු ඇත.

02. ආයතනයේ අරමුණු

1) නූතන, පශ්චාත් - ද්විතියික තාක්ෂණික ආයතනයක් සමග අනුකූල වන භෞතික පරිසරයක් ස්ථාපිත කිරීම.
2) සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි මහත්වූ ශිෂ්‍ය ප්‍රජාවට නම්‍යතාවයෙන් ලගාවිය හැකි ඉගැන්වීමේ සහ කුසලතා පුහුණු කිරීමේ ක්‍රම වේදයක් නිර්මාණය කිරීම.
3) ප්‍රායෝගිකව උචිත වන පර්යේෂණ දිරිගැන්වෙන පරිසරයක් ස්ථාපිත කිරීම සහ නව්‍යකරණ සහ නිර්මාණශිලිත්වය සඳහා උනන්දු කරවීම.
4) අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ශක්තිමත් වූ හවුල් සබදතාවයක් ගොඩනැගීම සහ කර්මාන්තයන්හි නියැලීම
5) සුදුසුකම් ලත් ක්‍රියාශිලි කණ්ඩායමක් වර්ධනය කිරීම
6) ශිෂ්‍යයින්ගේ පූර්ණ සංවර්ධනයක් ප්‍රවර්ධනය කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීම
7) ආයතනයේ සියළුම ක්ෂේත්‍රයන්හි තත්වය සහ කාර්යක්ෂමතාවය සහතික කෙරෙන කළමනාකරණ පද්ධතියක් වර්ධනය කිරීම.

03. ජාතික තාක්ෂණික පාඨමාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටි විස්තරයක් සහ මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය ස්ථාපිත කිරීම.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ (එන්.ඩී.ටී) මූලාරම්භය මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ දී ඇතිවුන අතර එය 1940 ගනන් දක්වා වූ කාලයකට දිව යනු ලැබේ. එහි ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බී.එස්.සී (ඉංජිනේරු) උපාධියට සිසුන් සූදානම් කරන, වර්ෂ හතරක තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව කනිෂ්ඨ කාර්මික නිලධාරි දෙවර්ෂ පාඨමාලාවන් ක්‍රියාත්මක කරන ලදී. කනිෂ්ඨ කාර්මික නිලධාරී පාඨමාලාව ඉතා හොඳ පිළිගැනීමක් ලද මධ්‍යම මට්ටමේ පාඨමාලාවක් වූ අතර මෙම පාඨමාලාව අවසන් කළ අය රටේ ඉංජිනේරු කේෂත්‍රයේ සංවර්ධනය සඳහා බොහෝ සෙයින් දායක වූහ.

1960 වර්ෂයේදී මොරටුව, කටුබැද්දෙහි ප්‍රායෝගික තාක්ෂණික ආයතනය පිහිටුවීමත් සමගම කනිෂ්ඨ කාර්මික නිලධාරී (එන්.ඩී.ටී) පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරුකරන ලදී. කැනඩා රජයේ ආධාර ඇතිව (අයි.පී.ටී) පිහිටු වූයේ ප්‍රායෝගික මූලාශ්‍ර සහිත මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා නිර්මාණය කිරීම සහ ක්‍රියාත්ම කිරීමටය.

1966 වර්ෂයේ දී ප්‍රායෝගික තාක්ෂණික ආයතනය, ලංකා කාර්මික කොලීජිය ලෙස උසස් කරන ලද අතර පාඨමාලා ව්‍යාප්තියත් සමගම වේගවත් සංවර්ධනයක් ද ඇතිවිය. ලංකා තාක්ෂණික කොලීජිය වර්ෂ පහක කාලයක් සඳහා වූ තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. තවද ජේ.ටී.ඕ පාඨමාලාව සංශෝධනය කොට යාන්ත්‍රික පුහුණුවක්ද ඇතුලත් කොට, එය වසර තුනක ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පත් කරන ලදී. මේ සංවර්ධන ක්‍රියාකාරීත්වයත් සමඟ, ලංකා තාක්ෂණික (සී.සී.ටී) එකම විශ්වවිද්‍යාලය යටතේ වූ, මණ්ඩපයක් බවට 1972 දී උසස් කරන ලදී. එතැන් සිට උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙනුවෙන් එන්.ඩී.ටී පාඨමාලාව, විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබීය. 1987 දී එන්.ඩී.ටී පාඨමාලාව, 1978 අංක 16 දරණ පනත අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වූ අතර මෙම පාඨමාලාවට ඇතුලත් වීමේ සුදුසුකම් වූයේ ජී.සී.ඊ උසස් පෙළ සමත්වීමය. මොරටුව විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මකවන (අයි.ටී.යූ.එම්) 2000 වසරේ අංක 3 දරණ ආඥා පනත යටතේ ස්ථාපිත කරන ලද්දේ එන්.ඩී.ටී සහ එයට සමාන්තර පාඨමාලා මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීමටය. තාක්ෂණික ආයතනය, කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර, පාඨමාලාවල ස්වාධීන සංශෝධනයන් සඳහා ඉවහල්වන, භෞතික වශයෙන් වෙන්ව පිහිටුවන ලබන ආයතනයක් ලෙස පිහිටුවීමේ, කාර්ය භාරය ඉටුවීම එම මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. ජේ.ටී.ඕ / එන්.ඩී.ටී සම්පූර්ණ කරන ලද අය ජාතියේ සංවර්ධන ක්‍රියාවලියට අතිවිශාල වශයෙන් දායකත්වයක් ලබා දෙති, එන්.ඩී.ටී පාඨමාලාවෙන් පුළුල් අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දෙන අතර මධ්‍යම මට්ටමේ කාර්මික කටයුතු ඉටුකිරීමට අවශ්‍ය හැකියාවන්ද ලබාදෙයි. තවද එය වැඩිදුර ශක්තිමත් පදනමක් ද ඇති කරනු ලැබේ. රටේ පවත්නා මධ්‍යම මට්ටමේ පාඨමාලාවල තත්වය මනින මිනුම් දණ්ඩයක් බවටද මනා පිළිගැනීමක් ලෙස එන්.ඩී.ටී පාඨමාලාව පත්ව ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක්

මෙම පාඨමාලාවේ මූලික අරමුණ වනුයේ අප රටෙහි කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය වන විවිධ ක්ෂේත්‍රවලට අදාල ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහිකිරිමය. ආයතනය ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන, 350 මුළු ශිෂ්‍ය සංඛ්‍යාවකට විෂයධාරා නමයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. අදාල විස්තර පහත සඳහන් පරිදි වේ.

රසායනික ඉංජිනේරු තාක්ෂණය	25
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	80
විදුලිය ඉංජිනේරු තාක්ෂණය	40
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය	40
නාවික ඉංජිනේරු තාක්ෂණය	15
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	60
නාවුක අධ්‍යයන තාක්ෂණය	15
පොලිමර් තාක්ෂණය	25
පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය	50

මෙයට අමතරව හමුදාවන්ට සහ විශ්වවිද්‍යාල අනධ්‍යයන කායයී මණ්ඩලය සඳහා ශිෂ්‍යයින් පස් දෙනෙක් උපරිම වශයෙන් ඇතුලත් කර ගැනීමට ඉඩ සලස්වනු ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම එයටම ආවේනික වු ක්‍රියාවලියක් තුලින් සිදුවේ. රජයේ ගැසට් පත්‍රයේ තෝරාගත් ප්‍රතිපත්ති පත්‍ර සහ වෙබ් අඩවිය තුල පළවන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. පසුගිය ජී.සී.ඊ උසස් පෙළ අඛණ්ඩව තෙවරක් පෙනී සිටි සිසුන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. ඉසෙඩ් ස්කෝර් දිස්ත්‍රික්ක / විශේෂ කුසලතා වෙන්කිරීම (විශ්වවිද්‍යාල ඇතුළත් කිරිම් මෙන්) සහ විවිධ විෂය ධාරාවන්ට ඇති ඔවුන්ගේ මනාපය පදනම් කරගත් ශිෂ්‍යයින් ඇතුලත් කරගනු ලැබේ.

පරිපූර්ණ ඩිප්ලෝමාධාරියකුගෙන් මූලිකව අපේක්ෂා කරනුයේ වෘත්තිමය ඉංජිනේරුවරයකු හෝ කළමනාකරුවකු සහ ක්ෂේත්‍රය / වැඩපල මට්ටමේ ශ්‍රම බලකාය අතර පවත්නා සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමයි. මෙම ක්‍රියාදාමය තුලින් ඩිප්ලෝමාධාරියාට තමන් වෘත්තීමය ලෙස හැඩගස්වා ගැනීමටත් සම්බන්ධීකරණ සහ කළමනාකරණ කුසලතාවයන් දියුණු කරගැනීමටත් අවශ්‍ය වේ. ඔහු / ඇය තමා තෝරාගත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතුය. මෙම අවබෝධය තුලින් ඔහු / ඇය වෘත්තීමය ඉංජිනේරුවරයකුගේ නව්‍යකරණය / නිර්මාණ ඇගයීමට හැකිවන අතර තම සහායකයින් සමග අදහස් හුවමාරුකර නව්‍යකරණය / නිර්මාණය යථාර්ථයක් බවට පත්කල හැකිවනු ඇත.

මෙම පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන කටයුතු සඳහා වන අතර එක් අවුරුදු කර්මාන්ත පුහුණුවකින්ද සමන්විතය. පළමු වසරට අදාල විෂයයන් සමාන්තර බව, ස්ථාවරත්වය සහ මූලික විද්‍යාවන් පිළිබඳ ශිෂ්‍යයාගේ දැනුම සහ ඔහු / ඇය තෝරාගනු ලැබූ විශේෂ විෂයධාරා අධ්‍යයනය හඳුන්වා දීම සඳහාය. මෙය ඉංජිනේරු විද්‍යා අභ්‍යාස සඳහා අවශ්‍ය මූලික කුසලතාවයන් හෙලිදරව් කරනු ඇත. (උදා: වැඩපොල තාක්ෂණ ඉංජිනේරු සැලසුම්) එක් විෂය ධාරාවක් සඳහා ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාල එකක් හෝ

ඊට වැඩි ක්ෂේත්‍ර විෂයයක් ලබාදෙනු ඇත. (උදා: සිවිල් ඉංජිනේරු විෂය ධාරාව සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම උගන්වනු ලැබේ.)

පහත සඳහන් කරුණු හේතුවෙන් පළමු වසරේදී ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය වේ.

1 ඩිප්ලෝමාධාරියකුගේ වෘත්තීයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. එනිසා සිසුන් තම අවබෝධ කර ගැනීම, කථනය, සහ වාර්තා ලිවීම පිළිබඳ කුසලතාවයන් වැඩි දියුණු කර ගත යුතුය.

2 ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව මුළුමුනින්ම ක්‍රියාත්මක කෙරෙනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. බොහෝ සිසුන් ජී.සී.ඊ උසස් පෙළ දක්වා තමන්ගේ ඉගෙනීම් කටයුතු කර තිබෙන්නේ සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් වන හෙයින් ඒ අයගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය බොහෝ සෙයින් වෙනස් වන අතර දියුණු කර ගැනීමට බොහෝ ඉඩකඩ ඇත.

දෙවන වසරේ විෂයයන් තුල ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍ර තුල විවිධ ඉංජිනේරුමය න්‍යායාත්මක සිද්ධවීම්වල නිරතව සිටීමය.

තෙවන වර්ෂය යොදාගෙන ඇත්තේ කර්මාන්තයෙහි නිරතවී ලබන අත්දැකීම් ලබා ගැනීම සඳහාය. පිලිගත් කර්මාන්ත ආයතනයන්හිදී ලබාදෙන පුහුණුව සංවිධානය කරනු ලබන්නේ සහ අධීක්ෂණය කරනු ලබන්නේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ කර්මාන්ත පුහුණුව භාර කථිකාචාර්යවරයා විසිනි.

වසර 3 ක ඉගෙනීමෙන් සහ පුහුණුවීමෙන් අනතුරුව සමත්වන සිසුන් හට විශ්වවිද්‍යාලය විසින් අනුමත කර ඇති කුසලතා නිර්නායක අනුව සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨ වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ.

ලකුණු අනුව නිරීක්ෂනය කෙරෙන අධ්‍යයනයකදී හෙළිදරව් වී ඇති පරිදි ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ලබායන අයගෙන් එසේ අධ්‍යයන කටයුතු අවසන් කර වසරක් තුල රැකියා නියුක්ත වීම 100% බව පෙන්නුම් කෙරේ.

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අංශයේ දැනට ක්‍රියාත්මක වන නව විෂය කලාව ඉදිරිපත් කරනු ලැබුවේ 2005 වර්ෂයේ දී පළමු වසර සිසුන් සඳහා වන අතර දෙවන වසර සිසුන් සඳහා 2006 වර්ෂයේදී ය. එහි අරමුණ වූයේ, කර්මාන්ත ලෝකයේ වර්තමාන තාක්ෂණ දියුණුව හා සමගාමීවන, සිසුන් තෝරාගත් විෂයධාරාවන්හි ඔවුන්ගේ දැනුම පුළුල් කිරීමය.

4. මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය නව ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

4.1 2017 වර්ෂයේ අවසානය දක්වා ව්‍යාපෘතියේ ප්‍රගතිය.(සාමාන්‍ය ලෙස)

I. මුලිකව හදුනාගත් කොන්ත්‍රාත්කරු (CATIC) විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් 2014.07.31 දින අවසන් කරන ලදී. ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියටත් කරගෙන යාම සදහාත් මුල්‍ය ප්‍රතිපාදන දේශිය බැංකුවලින් ලබාගැනීම සදහාත් විකල්ප සැලසුම් සහ නව කොන්ත්‍රාත්කරු ලෙස International Construction Consortium (ICC) කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් 2014.09.18 දින අනුමත කරන ලදී. (කැබිනට් පත්‍රිකා අංක 14/1148/ 521/032 සහ 2014.08.14 දරණ)

II. අදාල ව්‍යාපෘති කටයුතු පිළිබද ප්‍රදාන ලිපිය කොන්ත්‍රාත්කරු (ICC) වෙත 2014.10.09 දින නිකුත් කරන ලදී.

III. මුලික කොන්ත්‍රාත්කරු (CATIC) ඔවුන්ගේ සියළු ලේඛන / වාර්තා මුලික පිටපත්ද සමහර අමතර පිටපත්ද සමග සංකල්පිත රූප සටහන් සමහර විස්තරාත්මක රූප සටහන්, ඉංජිනේරු වාර්තා, රසායනාගාර උපකරන සදහා වූ මුලික කටයුතු ආදිය 2014.10.15 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දෙන ලදී. ඉක්බිතිව මේ සියල්ල නව කොන්ත්‍රාත්කරු (ICC) වෙත භාර දෙන ලදී.

IV. නව කොන්ත්‍රාත්කරු (ICC) 2014.10.16 දින සුභ නැකතින් ඉදිකිරීම් පරිශ්‍රය වෙත පැමිණ ඉදිකිරීම් කටයුතුවල මුලාරම්භයක් ලෙස ගොඩනැගිල්ලක කොන්ක්‍රීට් අත්තිවාරමෙන් ස්ථාපිත කරන ලදී. ව්‍යාපෘති ආරම්භක රැස්වීම 2013.10.23 දින පවත්වන ලදී.

V. යටිතල පහසුකම් සම්බන්ධයෙන් ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය (අධ්‍යයන සහ පරිපාලන ප්‍රදේශ) ශිෂ්‍ය නේවාසිකාගාර, විවිධ කටයුතු සදහා වූ ශාලාව, කාර්ය මණ්ඩල නේවාසිකාගාර, ආගන්තුක නිවාසය, වෙලද කටයුතු සංකීර්ණය සහ අභ්‍යයන්තර මාර්ග ජාලයද සම්පූර්ණ කර ඇත.

VI. මෙයට අමතරව ව්‍යාපෘතියේ ප්‍රධාන ම කාර්යය වූයේ යන්ත්‍ර සූත්‍ර, උපකරණ, දැව භාණ්ඩ ආදිය මිල දී ගැනීම සහ සවි කිරීම.

VII. ව්‍යාපෘතියේ කාර්යය මණ්ඩල පුහුණු කිරීමේ කාර්යයට අදාල කටයුතු අවසන් කෙරින.

VIII. ව්‍යාපෘතියේ හිමිකරුගේ කාර්ය මණ්ඩලයන් ව්‍යපෘති සංවර්ධනය සදහා වූ කාර්ය මණ්ඩලයත් අතර සවිස්තරාත්මක ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන / තීරණ ගැනීමේ සතිපතා රැස්වීම් අඛණ්ඩව ව්‍යාපෘති හිමිකරුගේ කාර්යාලයත් සංවර්ධනය කෙරෙන කාර්ය මණ්ඩලයත් අතර පැවතියද මෙම වැඩ පිළිවෙලට ප්‍රධාන ව්‍යාපෘති නිළධාරින්ගේ නිල රාජකාරිය අඛණ්ඩව පැවැත්වීමේ ප්‍රමාදයත් හේතුවෙන් බාධා ඇතිවිය.

IX. ව්‍යාපෘති අධ්‍යක්ෂ හැර ව්‍යාපෘති කාර්යාල කාර්යය මණ්ඩලය පත් කරන ලදී.

X. යටිතල පහසුකම් සියල්ල ඉදිකිරීම් ද උපකරණ සහ දැව භාණ්ඩ සවි කිරීම් බෙහෝමයක් 2017 අප්‍රේල් මස අවසන් වන විට අවසන් කර ඇත.

XI. 2017.05.22 දින මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ කාර්යය මණ්ඩලය නව ගොඩනැගිලි සංකීර්ණයට ඇතුලත් වූ අතර සිසුන් ජුනි මස ඇතුලත් වූහ.

XII. 2017.08.10 දින ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ගොඩනැගිලි සංකීර්ණය උත්සවාකාරයෙන් විවෘත කරන ලදි.

XIII. බොහෝ දුරට අවසන් කෙරුනු ව්‍යාපෘතිය, ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අය (ICC) විසින් 2017.10.30 දින අමාත්‍යංශය හරහා මොරටු විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයට භාර දෙන ලදි.

XIV. අඩුපාඩු පිළිබඳ බැඳී සිටීමේ කාල සීමාව 2018.11.30 දින දක්වා පවතිනු ඇත.

4.2 ව්‍යාපෘතියට අදාල වන සමාලෝචිත වර්ෂය තුල ලබා ගත් සැලකිය යුතු ජයග්‍රහණ.

1. හෝමාගම, දියගම නව භූමි භාගයෙහි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය නැවත ස්ථානගත කරන ලදි.
2. අධ්‍යයන කාර්යය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහනෙහි ප්‍රතිඵලයක් ලෙස එන්.ඩී.ටී. විෂය මාලාව වාර්ෂික ක්‍රමය වෙනුවට වාර ක්‍රමයට මාරු කිරීමට තීරණය කිරීම.
   පළමු සහ දෙවන වාර සඳහා විෂය මාලාව පූරණය කර ඇති අතර එය අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් පිළිගෙන ඇත.

05. ආයතන පරිශ්‍රය

ආයතනය තුල ඇති අධ්‍යයන අංශ

ආයතනය තුල ඇති පහසුකම්

පුස්තකාල පහසුකම්





කායවර්ධන මධ්‍යස්ථාන පහසුකම්

නේවාසිකාගාර පහසුකම්

06. ආයතනයේ කළමනාකරණ මණ්ඩලය

1	එම්.එම්.පි.ඩී	සමරසේකර මහත්මිය	අධ්‍යක්ෂ - තාක්ෂණික ආයතනය
2	මාධව	දේවසුරේන්ද්‍ර මහතා	උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමාගේ නාමිත
3	ඒ.ඩබ්	සෙනෙවිරත්න මහතා	නාමිත නාවික විෂයභාර ඇමතිතුමාගේ අමාත්‍යංශ ලේකම්තුමාගේ
4	ආර්.එම්.ඒ.පී	සමරදිවාකර මහත්මිය	ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ සභාපතිතුමාගේ නාමිත
5	මහාචාර්ය කේ.කේ.සී.කේ	පෙරේරා මහතා	පීඨාධිපති, ඉංජිනේරු පීඨය
6	මහාචාර්ය එම්.එල්	ද සිල්වා මහතා	පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය
7	ගෘහ නිර්මාණ ශිල්පී	ඇෂ්ලි දි වොස් මහතා	පාලක සභා නියෝජිත
8	මහාචාර්ය එස්.එම්.ඒ	නානායක්කාර මහතා	සභාතන සභා නියෝජිත
9	ආචාර්ය ටි.ඒ.ජී	ගුණසේකර මහතා	මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත
10	එස්.එල්	ජයසූරිය මහත්මිය	
11	ආචාර්ය ඒ.එම්.එන්	අලගියවන්න මහතා	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිත
12	ජේ.කේ	ලංකාතිලක මහතා	
13	මහාචාර්ය ජේ.ආර්	ලූකස් මහතා	

07. ආයතනයේ නිළධාරීන්

අධ්‍යක්ෂ	එම්.එම්.පි.ඩි සමරසේකර මහත්මිය *B.Sc. (Eng.) (Moratuwa),* *M. Eng. (Moratuwa),* *MPhil (Moratuwa)*	
නියෝජ්‍ය ලේඛකාධිකාරි	කේ.සි සංජීවනී පෙරේරා මහත්මිය *BSc. (Hons)(Sri J' pura),* *PGDBM (Colombo)* *MBS (Merit)(Colombo)*	2017 අගෝස්තු දක්වා
නියෝජ්‍ය මුල්‍යාධිකාරි	පුරප්පාඩුවී ඇත.	
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි	එස්.ආර්.එස් උදේශි මහත්මිය *BSc. (Agri.) (Ruhuna)* *Mphil (Agri.) (Peradeniya)*	2017 අගෝස්තු දක්වා
ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි	එස්.පි.ඩි පිරිස් මහත්මිය *B.Com (Sp)-KLN,* *PGDIP (Pub. Mgt.)-SLIDA,* *CBA*	

තැපැල් ලිපිනය

තාක්ෂණික ආයතනය
මොරටුව විශ්වවිද්‍යාලය
දියගම
හෝමාගම,
ශ්‍රී ලංකාව.

දුරකථන අංක	පොදු	: 0112124000
	ෆැක්ස්	: 011 2124018
	අධ්‍යක්ෂ	: 011 2124001
	නියෝජ්‍ය ලේඛකාධිකාරි	: 011 2124002
	ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි	: 011 2124003

7.1 සංවිධාන සැලැස්ම - 2017



08. කාර්ය මණ්ඩල සහ සිසුන් පිළිබඳ විස්තර

අධ්‍යයන අංශ	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	243	කථිකාචාර්යවරු P –06 V- 02 C-01 උපදේශකවරු T – 04 V-10	P- 05 (04 - දියගම පරිශ්‍රයේ ස්ථාපනය කිරීමෙන් පසු)
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	253	කථිකාචාර්යවරු P – 06 ETA – 01 (06.09.2017) C- 01 NDA Lecturer – 06 NDA Instructors – 04 තාවකාලික උපදේශකවරු T – 09 බාහිර කථිකාචාර්යවරු VL -06 බාහිර උපදේශකවරු V - 24	P- 09
පොලිමර්, රෙදිපිළි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	293	කථිකාචාර්යවරු P – 07 C – 03 V – 08 උපදේශකවරු T – 06 V – 09	P- 11 T- 01
විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	241	කථිකාචාර්යවරු P – 09 V – 02 උපදේශකවරු T – 09 V – 07	T- 10
අන්තර්විෂය මාලා අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	350	කථිකාචාර්යවරු P – 08 C – 03 V – 04 උපදේශකවරු T – 03 V – 01	P- 03 2017 දෙසැම්බර් දක්වා T- 02

P – ස්ථිර
C- කොන්ත්‍රාත්
T- තාවකාලික

NDA-ජාතික ඩිප්ලෝමා සංගමය
V- බාහිර

8.1 දේශිය සිසුන් පිළිබඳ විස්තර

ආයතනයට සිසුන් 350 ක් ඇතුලත් කරගනු ලබන අතර ක්ෂේත්‍ර 9 කින් සමන්විත වේ. එනම් රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත් හා විදුලි සන්දේශ, නාවික, යාන්ත්‍රික හා නාවුක වේ.

අධ්‍යයන අංශය	පාඨමාලාව	මාධ්‍යය	සිසුන් ඇතුලත් කිරීම 2017	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	උපාධිධාරීන් සංඛ්‍යාව
සිවිල් ඉංජිනේරු තාක්ෂණ.	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	80	80	81	82	90
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	90	90	86	77	70
පොලිමර්, රෙදිපිළි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	98	97	98	98	82
විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	80	82	83	77	81
අන්තර්විෂය මාලා අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි					
එකතුව			348	349	348	334	323

8.2 අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර (2017.12.31)

කාර්ය මණ්ඩල වර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවන සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 3 to U-AC 5	55	36	19
	U-AC 1 to U-AC 2	-	-	-
ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	U-EX 1 to U-EX 3 (Administrative & Financial Staff)	08	02	06
	U-EX 1 to U-EX 3 (Other Executive Staff)	01	-	01
අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය	U-AS 1	06	01	-
	U-AS 2,2	04	-	04
තාක්ෂණික කාර්ය මණ්ඩලය	U- MT 1	36	12	24
ලිපිකරු හා සමාන	U-MN 1	36	25	11
	U-MN 2,3	04	02	02
	U-MN 4	02	02	-
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 1 to U-PL 3	78	35	43

09. පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් කරන ලද පර්යේෂණ කටයුතු වල සොයාගැනීම් දේශීය සහ විදේශීය වශයෙන් ඉදිරිපත් කර ඇති අතර හා ප්‍රකාශිතව ඇත.

ලේඛකවරු	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය
භද්‍රානී තෝරදෙණිය. උත්පලා පින්ටෝ. බසන්ත් මහේෂ්වරී	කෘෂිකර්මය සහ සමාජ සුභසාධනය සඳහා ගුනාත්මක ජලයේ ඇති ක්‍රියාකාරීත්වය. ශ්‍රී ලාංකීය ඉතා වැදගත් තොරතුරු අධ්‍යයනයකි.	පරිසර විද්‍යාව පරිසර දූෂණ පර්යේෂණ - ස්ප්‍රින්ගර්
බුලත්සිංහල ඒ. තෝරදෙණිය බී.	ජල පයිප්ප හරහා ලැබෙන ජලය පිළිබද තුලනාත්මක අධ්‍යයනයකි.	සංස්ථාපිත ඉංජිනේරු වෙළුම 17 (1) සංස්ථාපිත ඉංජිනේරු ආයතනය ශ්‍රී ලංකාව
භද්‍රානී තෝරදෙණිය. බසන්ත් මහේෂ්වරී.	පරිච්ඡේදය 14, ජල සම්පත් කළමණාකරණය සඳහා ජල නිපුණත්වය පිළිබද කරුණු.	ජල ගැලීම් ආපදා පිළිබද අවබෝධය සහ ආපදා කළමණාකරණය,අවිනිශ්චිත අනාගතයක් සඳහා අවදානම් සහ අවස්ථා හඳුනා ගැනීම.
කණ්ඩම්බි ජී.ඩබ්.ටී.සී.	තාක්ෂණය සහ ඉගෙනීම ප්‍රවර්ධනය කෙරෙන පාඨමාලාව.	උසස් අධ්‍යාපනය සඳහා ජාත්‍යයන්තර සගරාව
කණ්ඩම්බි ජී.ඩබ්.ටී.සී.	සාදා ගත් මැටියෙන් බිත්ති සාදන තාක්ෂණය සහ එහි සංවර්ධනය.	ඉංජිනේරුවන්ගේ ජාත්‍යන්තර සගරාව ප්‍රවනතාවයන් සහ තාක්ෂණය.
වීරසිංහ කේ.ඒ.බී. වීරසූරිය ඒ.යූ.	පිබිදෙන කොළඹ, සුළග හමන දිශා පිළිබද ඉංජිනේරුමය අදහස.	ඉංජිනේරුවරුන්ගේ ආයතනය - ශ්‍රී ලංකාව සාකච්ඡා වාර්තාව 2017
මනුජිත් සාගර වීරසිංහ කේ.ඒ.බී. කසුන් නන්දපාල	නිවසක විවර තුනක් හෝ වැඩි ගණනක් තිබීමේ බලපෑම.ඉංජිනේරු දැක්ම, ද්‍රව ගණිත විද්‍යාව උපයෝගී කර ගැනීම.	ජාත්‍යන්තර පර්යේෂණ සම්භාෂණය. (KDUIRC 2017)
මනුජිත් සාගර වීරසිංහ කේ.ඒ.බී. කසුන් නන්දපාල	ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබද චාරිත්‍ර සහ ඇදහීම් සම්බන්ධ සමකාලීන සහ තුලනාත්මක අධ්‍යයනය කි.	විවිධ විෂයධාරා සම්බන්ධව සමීප වීම පිළිබද ජාත්‍යන්තර සම්මේලනය. පශ්චාත් උපාධි පීඨය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
මනුජිත් සාගර කසුන් නන්දපාල බුද්ධික වීරසිංහ	වාස්තු විද්‍යා, ෆෙන්ග්ෂුයි සාම්ප්‍රදායික විශ්වාස වලට එරෙහිව සිවිල් ඉංජිනේරු තාක්ෂණය.	ලැම්බට් අධ්‍යයන ප්‍රකාශණ **ISBN: 978-620-2-05837-7**

පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

ලේඛකවරු	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය
සෝමරත්න එම්.සී.ඩබ්.	බලාත්මක යාන්ත්‍රික සහ සාම්ප්‍රදායික පන්ති කාමර ක්‍රම තුලින් සත්‍ය අවස්තාවන් උදෙසා කුසලතා දියුණුවට දැනුම යෙදවීම.	දේශන සහ ඉන් එහා ඉගෙනුම් අත්දැකීම් තුලින් උසස් අධ්‍යාපනයක් ලබා දීම. SLAIHEE - ශ්‍රී ලංකාව
සෝමරත්න එම්.සී.ඩබ්. සිල්වා එස්.එන්.එච්. ලියනගේ එන්.එම්.වී.කේ. වල්පලගේ එස්.	Dynamic mechanical and thermal properties of natural rubber latex films filled with surface modified silica.	පරිගණක විද්‍යාව සහ තාක්ෂණය උසස් මට්ටමකට ගෙන ඒමේ ජාත්‍යන්තර සම්මේලනය. කැලණිය විශ්වවිද්‍යාලය - KICACT 2017
පෙරේරා එස්.	කතන්දර කීම තුලින් සක්‍රීය ඉගෙනුම පහසු කිරීම.	සත්‍ය අවස්ථාවන් උදෙසා දේශන සහ ඉන් එහා සාම්ප්‍රදායික පන්ති කාමර ක්‍රම ඉගෙනීමේ අත්දැකීම් තුලින් කුසලතා දියුණුව සඳහා උසස් අධ්‍යාපනය ලබා දැනුම යෙදවීම. SLAIHEE - ශ්‍රී ලංකාව
සුජානි බී.වයි. අබේවර්ධන ශ්‍රීමාලා පෙරේරා ද සිල්වා කේ.එම්.එන්. වල්පලගේ එස්.	තෙත නයිලෝන් ෆැබ්රික් නිශ්පාදනය සඳහා ජීවවිද්‍යා පෙළඹවීම් ක්‍රමවේදය.	නැනෝ විද්‍යාව සහ නැනෝ තාක්ෂණය පිළිඹද ජාත්‍යන්තර සම්මේලනය. ශ්‍රී ලංකාව
ජයතුංග ජී.කේ. අමරසිංහ බී.එම්.ඩබ්.පී.කේ.	Determination of moisture diffusivity of black pepper drying in conventional spouted bed	මොරටු විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය වාර්ෂික සම්භාෂණය - 2017
අබේකෝන් කේ.එම්.ඩබ්. ජුලියන් එල්.ඩී. නානායක්කාර එෆ්. පුංචිහේවා එච්.කේ.ජී.	Usability study for validating WARM mapping framework	මොරටු විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය වාර්ෂික සම්භාෂණය - 2017
වීරකෝන් ඒ.ඩී.	කාර්මික පුහුණු වීමත් විශ්වවිද්‍යාල පරිසරයත් අතර ඇති පරතරය පියවීම.පෝස්ටර් දැන්වීම් මගින් ක්‍රියාකාරී දැනුම පුලුල් කිරීම.	ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සම්බන්ධ SLAIHEE 13 වන වාර්ෂික සම්මේලනය - 2017.06.23 විවෘත විශ්වවිද්‍යාලය
වීරකෝන් ඒ.ඩී.	**(i)** A novel approach to Enhance student' attention span: A digital framework among the polymer engineering technology students. (ii) Automotive windshield wiper blade from incorporating RSS/Skim rubber blend in the EPDM formulation. (iii) Improvement of rubber to steel adhesion in press-on solid tyres by varying the NR/BR composite bonding layer. (iv) Facilitating an E-learning platform beyond the lectures: Digital native become active learners.	පරිගණක භාවිතය සහ තාක්ෂණය පිළිඹද කැලණිය ජාත්‍යන්තර සම්මේලනය - 2017.07.23 පරිගණක භාවිතය සහ තාක්ෂණික පීඨය කැලණිය විශ්වවිද්‍යාලය

පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

ලේඛකවරු	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය
වීරකෝන් ඒ.ඩී.	උපාධිධාරී බව ආරෝපනය කිරීම සඳහා නවතම තක්සේරුව පොලිමර් ඉංජිනේරු සිසුන් සමග අධ්‍යයනයකි.	විවිධාකාර ලෙස හික්මීම ඇති කරන ක්‍රම පිළිබඳ 4 වන ජාත්‍යන්තර සම්මේලනය 2017 (සැප්තැම්බර් 20 – 22 දක්වා)
අබේවර්ධන එස්.බී.වයි. පෙරේරා එස්. ද සිල්වා කේ.එම්.එන්. වල්පලගේ එස්. සෝමරත්න එම්.පී.ඩබ්.	Mimiking elephant mud bathing to produce wettable polyester.	Material Letters
අබේවර්ධන එස්.බී.වයි. පෙරේරා එස්. ද සිල්වා කේ.එම්.එන්. වල්පලගේ එස්. සෝමරත්න එම්.පී.ඩබ්.	A facile method t modify betonite nanoclay with silane.	International Nano Letter
බඹරවානගේ ටී. කුමාරවඩු එස්. රොද්‍රිගෝ එස්.	නිරූපනයෙහි යෙදීම සහ අනුකරණයෙහි දැක්ම සහ මධ්‍යම ප්‍රමාණයේ බලාගාර ක්‍රමයක් පාලනය කිරීම.	
ප්‍රේමරත්න පී.බී.ටී.කේ.	Abstract: Incorporating gamification into ESL classroom via Kahoot !	මානව ශාස්ත්‍රය පිළිඹද අන්තර්ජාතික සම්මන්ත්‍රණය (ICH 2017) ඔක්තෝබර් 26 - 27
ප්‍රේමරත්න පී.බී.ටී.කේ.	Integrating Generic Skills into ESL curriculum	මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය වාර්ෂික සම්භාෂණය - 2017
මතුගම එස්.සී.	හදිසි අවස්ථාවන්හි දී විශාල පන්ති කාමරවල සිසුන්ගේ ඉගෙනීමේ බලපෑම.	උසස් අධ්‍යාපනය සම්බන්ධ 13 වන SLAIHEE වාර්ෂික සම්මේලනය - ශ්‍රී ලංකාව
සපරමාදු එස්. සමන් බණ්ඩාර	Optimal Terminal Configuration for Minimizing passengers waiting time	තුන්වන ජාත්‍යන්තර සම්මේලනය - MERCon 2017
යටපාන පී.එස්. සූරියආරච්චි එම්.ආර්.	විශ්වවිද්‍යාලයට තේරීමේ දී ක්‍රම දෙකක් උපයෝගී කිරීමේ තුලාත්මක බලපෑම. Z අගය සහ CCI ක්‍රමය	ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛණ සම්මන්ත්‍රණය - 2017
නාගොඩවිතාන එස්. උමාලෙබ්බේ ජේ.එච්.	CLT පන්ති කාමරයේ ව්‍යාකරණ ඉගැන්වීම	මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය වාර්ෂික සම්භාෂණය - 2017

10. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

වැඩසටහන් සම්මනත්‍රණ/_වැඩමුළු	පැවැත්වුණු දින	සහභාගී වූවෝ	අදහස් දැක්වීම
තීරන ගැනීමේ කුසලතා	03 ජනවාරි 2017	අධ්‍යයන කාර්ය මණ්ඩලය	ආචාර්ය නලින් ජයසූරිය මයා.
හැඟීම්බර බුද්ධිමත්කම වර්ධනය	18 පෙබරවාරි 2017	අධ්‍යයන කාර්ය මණ්ඩලය	ආවේන් ලෝ මිය.
එස් 5 පුහුණුවීම	24 පෙබරවාරි, 2017	සියළු ම අයි.ටී.යු.එම්.කාර්යය මණ්ඩලය	ලාල් ෆොන්සේකා මයා.
කථා කිරීමේ ශිල්පය පිළිබඳ වැඩසටහන	02 මාර්තු 2017 (සති 10)	සියළු ම අයි.ටී.යු.එම්.කාර්යය මණ්ඩලය	ඉංජිනේරුවරුන්ගේ ආයතනය - ශ්‍රී ලංකාව
වාර්ෂික පර්යේෂණ සම්භාෂණය	08 සැප්තැම්බර්, 2017	**අධ්‍යයන කාර්ය මණ්ඩලය**	ප්‍රධාන ආරාධිත - මහාචාර්ය පී.එම්.ගුනරත්න විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ උප සභාපති
විෂයමාලා සංශෝධනය සහ එන්.ඩී.ටී.වැඩසටහනට වාර ක්‍රමය හැඳින්වීම	20 ඔක්තෝබර්, 2017	**අධ්‍යයන කාර්ය මණ්ඩලය**	වාර ක්‍රමය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදි
වාර්ෂික මිණුම් කඳවුර	නොවැම්බර් 2017	**එන්.ඩී.ටී.සිවිල් ඉංජිනේරු සිසුන් සඳහා**	
අයි.ටී.යු.එම්. නවක කාර්ය මණ්ඩලයට පුහුණු වීම් වැඩමුළු	27 නොවැම්බර් - 08 දෙසැම්බර් 2017	**පරිපාලන සහායක කාර්ය මණ්ඩලය**	සම්පත් දායක: අධ්‍යක්ෂ/ අයි.ටී.යු.එම්. නියෝජ්‍ය ලේඛකාධිකාරී/ අයි.ටී.යු.එම්. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී/ අයි.ටී.යු.එම්. ආචාර්ය ටී.ඒ.ජී.ගුණසේකර මයා. සෝමසිරි ද සිල්වා මයා. ලාලනී රාජපක්ෂ මිය.
ස්ථාවර වත්කම්,භාණ්ඩ ලේඛණ කිරීම් සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය	09 දෙසැම්බර් 2017	**අංශ ප්‍රධානීන් කාර්මික නිළධාරීන් සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්**	බෝගමුව එම්.එම්.ජේ.ආර්. අභ්‍යන්තර විගණන නිළධාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ

හඳුනාගැනීමේ චාරිකා - සබරගමුව විශ්වවිද්‍යාලය
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
යාපනය විශ්වවිද්‍යාලය

11. ලැබුණු ප්‍රදානයන් පිළිබඳ විස්තර

ඩිප්ලෝමා ප්‍රදාන උත්සවයේ දී සිසුන් විසින් විශිෂ්ය සාමාර්ථ සහතික පත් 14ක් ලබා ගන්නා ලදි.

රසායන ඉංජිනේරු තාක්ෂණය	0
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	01
විදුලි ඉංජිනේරු තාක්ෂණය	0
ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු තාක්ෂණය	0
නාවික ඉංජිනේරු තාක්ෂණය	06
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	0
නාවුක අධ්‍යයනය	0
පොලිමර් තාක්ෂණය	03
රෙදිපිළි ඉංජිනේරු තාක්ෂණය	04

12. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂයය		2016 රුපියල්	2017 රුපියල්
අ.	පෞද්ගලික වැටුප් සහ වේතන	126,750,510.00	147,176,344.00
ආ.	ගමන් වියදම්	198,550,00	157,562.00
ඇ.	සැපයීම්	3,418,066.00	7,496,517.00
ඈ.	නඩත්තු කටයුතු	1,471,539.00	1,968,971.00
ඉ.	ගිවිසුම් ගත සේවා	2,494,033.00	45,675,282.00
ඊ.	වෙනත්	8,666,826.00	11,318,891.00
එකතුව		**142,999,524.00**	**213,793,567.00**

13. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂයය		2016 රුපියල්	2017 රුපියල්
අ.	දැව භාණ්ඩ රසායනාගාර සහ කාර්යාල උපකරණ මිල දී ගැනීම	2,495,336.00	953,410.00
ආ.	යන්ත්‍ර සහ මැෂින් මිල දී ගැනීම	-	-
ඇ.	ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත් පත් කර ගැනීම	-	-
ඈ.	වෙනත්	1,012,466.00	545,656.00
එකතුව		**3,507,802.00**	**1,499,066.00**

14. ව්‍යාපෘති අරමුදල් පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල්)

නම	මුළු පිරිවැය රුපියල්	2016 වැය රුපියල්	2017 වැය රුපියල්	එකතු කළ වැය 31.12.2017	% භෞතික සංවර්ධනය
දියගම පරිශ්‍රයේ නැවත ස්ථාපිත කෙරෙන මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය		10,297,372.00	10,360,051.00	54,609,670.00	
එකතුව		**10,297,372.00**	**10,360,051.00**	**54,609,670.00**	

15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වැය)

විෂයය		ප්‍රතිපාදන 2017 රුපියල්	වියදම 2017 රුපියල්	ඉතිරිය/අතිරික්තය රුපියල්
අ.	පුනරාවර්තන ව්‍යාපෘතිය හැර	169,854,000.00	213,793,567.00	(43,939,567.00)
ආ	මූලධන ව්‍යාපෘති හැර	6,000,000.00	1,499,066.00	4,500.934.00
එකතුව		**175,854,000.00**	**215,292,633.00**	**(39,438,633.00)**

16. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම)

ආදායමේ ස්වභාවය		ප්‍රතිපාදන 2017 රුපියල්	එකතු වීම් 2017 රුපියල්	ඌනතාවය/අතිරික්තය රුපියල්
අ.	**අභ්‍යන්තර අදායම**	6,000,000.00	4,206,230.00	1,793,770.00
එකතුව		**6,000,000.00**	**4,206,230.00**	1,793,770.00

17. මූල්‍ය ක්‍රියාකිරීත්වය සමාලෝචනය - 2017

විෂයය		ක්‍රමය	ඒක ශිෂ්‍ය වියදම
අ.	ඒක ශිෂ්‍ය පුනරාවර්තන වැය	පු. වැය ශිෂ්‍ය සංඛ්‍යාව	208,782.00
ආ.	ඒක ශිෂ්‍ය මුලධන වැය	මූ. වැය ශිෂ්‍ය සංඛ්‍යාව	1,464.00
එකතුව			**210,246.00**

18. වෙනත් විස්තර

2017 වර්ෂය තුල ආයතනය කාල උපලේඛණ අනුව විෂයධාරා 09 ට අදාල සියළු ම අධ්‍යයන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට සමත් විය.

තව ද ආයතනය විසින් පස්වන වරටත් අඛණ්ඩව වාර්ෂික පර්යේෂණ සම්භාෂණය සාර්ථකව 2017 වසරේ දී ද ක්‍රියාත්මක කරන ලදි.

19. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය
2017 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

වත්කම්	සටහන්	2016 (රුපි)	2016 (රුපි)	2017 (රුපි)	2017 (රුපි)
ජංගම වත්කම්					
බැංකුවේ ඇති මුදල්	1	24,998,899		9,633,528	
ලැබිය යුතු දෑ	2	11,121,286		13,094,194	
තොගය		863,553		1,812,967	
පෙර ගෙවීම්	3	169,264		400,940	
අයෝජන (කෙටිකාලීන)		0	**37,153,002**	0	**24,941,629**
ජංගම නොවන වත්කම්					
අයෝජන (දිගුකාලීන)	4	14,433,695		19,082,110	
දේපල පිරියත හා උපකරණ	5	53,167,577		10,076,377,354	
කෙරිගෙන යන වැඩ	5(a)	44,249,619		43,462,119	
වෙනත් වත්කම්	6	1,564,353		1,355,149	
			113,415,244		10,140,276,732
මුළු වත්කම්			**150,568,246**		**10,165,218,361**
බැරකම්					
ජංගම බැරකම්					
ගෙවිය යුතු දෑ	7	6,069,336		12,165,602	
අත්හිටවූ අදායම්	8	82,560		3,031,349	
උපචිත වියදම්	9	3,828,470	9,980,366	19,321,529	34,518,480
ජංගම නොවන බැරකම්					
පාරිතෝෂික ගෙවීම් සදහා ප්‍රතිපාදන			21,558,879		24,782,579
මුළු බැරකම්			(31,539,245)		(59,301,059)
මුළු ශුද්ධ වත්කම්			**119,029,001**		**10,105,917,302**
ශුද්ධ වත්කම් / හිමිකම්					
වැයවූ මූලධන ආධාර	10	21,689,481		10,036,984,632	
කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධන ගිණුම	10(a)	71,640,819		71,640,819	
වැයනොවූ මූලධන ආධාර	11	7,024,280		11,525,214	
පොදු සංචිතය	12	(13,533,842)		(55,307,685)	
පරිත්‍යාග	13	4,093,286		4,093,286	
මූල්‍ය නොවන රාජ්‍ය දීමනා	14	7,250,000		7,250,000	
ඒකරාශි වූ අරමුදල	15	20,864,977		22,271,443	
ශේෂ අතිරික්තය				7,459,593	
			119,029,001		**10,105,917,302**
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්			**119,029,001**		**10,105,917,302**

පිටු 33 සිට 37 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශන වලට අයත් කොටසකි. මෙම මුදල් ප්‍රකාශන පිළියෙල කිරීමෙන් ඉදිරිපත් කිරීමක් කළමනාකරන මණ්ඩලයේ වගකීම් වේ. ආයතනයේ කළමනාකරන මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලද්දේ:-

අක/ එම්.එම්.පී.ඩී සමරසේකර මිය	අක/ එස්.එම්.ඒ.නානායක්කාර මයා	අක/ එස්.පී.ඩී පිරිස් මිය	අක/එන්.ඩී.කුරුප්පුආරච්චි මයා
අධ්‍යක්ෂතුමිය	සමාජික / කළමනාකරණ මණ්ඩලය	ජ්.ස මුල්‍යාධිකාරී	ජ්‍යෙෂ්ඨ සහකාරලේඛකාධිකාරී

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

මෙහෙයුම් අදායම	සටහන	2016 (රුපි)	2017 (රුපි)
පුනරාවර්තන ආධාර		153,600,000	169,854,000
රජයේ ආධාර - මහපොළ		4,949,900	4,910,000
රජයේ ආධාර - ශිෂ්‍යාධාර		17,272,300	17,897,100
වෙනත් අදායම්	**16**	2,482,397	6,405,142
ක්‍රමක්ෂය		8,034,439	7,142,998
වෙනත් ආධාර			5,200,000
පර්යේෂණ දිරිගැන්වීමේ ආධාර			206,225
නායකත්ව සංවර්ධන දීමනාව			
ශිෂ්‍ය කේන්ද්‍ර අධ්‍යයන දීමනාව			
හැකියාව වර්ධනය සඳහා ආධාර		478,215	26,730
		186,817,251	**211,642,195**
මෙහෙයුම් වියදම්			
පෞද්ගලික වැටුප් හා වේතන	**17**	126,750,510	147,176,344
ගමන් වියදම්	**18**	198,550	157,562
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය	**19**	3,418,066	7,496,517
නඩත්තු කිරීමේ වියදම්	**20**	1,471,539	1,968,971
ශිවිසුම් සේවා	**21**	2,494,033	45,675,282
පර්යේෂණ හා සංවර්ධන වියදම්	**22**	369,348	472,775
කාලය සහ ක්‍රමක්ෂය වියදම්		8,034,439	6,897,170
වෙනත් මෙහෙයුම් වියදම්	**23**	8,588,611	10,846,116
මහපොළ		4,949,000	4,910,000
ශිෂ්‍යාධාර		17,272,300	17,897,100
පර්යේෂණ දිරිගැන්වීමේ වියදම්			206,225
හැකියාව වර්ධනය කිරීමේ වියදම්		478,215	26,730
නව ස්ථානගතකිරීම් සහ සංවර්ධනය ව්‍යාපෘති වියදම්		10,297,372	10,360,051
මුළු මෙහෙයම් වියදම්		**184,322,883**	**254,090,843**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවුනු අතිරික්තය / ඌනතාවය		**2,494,368**	**(42,448,648)**
වත්කම් ඉවත් කිරීමේදී ලත් ලාභය		**203,900**	**0**
		2,698,268	**(42,448,648)**

අක / එස්.පී.ඩී පීරිස් මිය
ජ්‍යෙෂ්ඨසහකාරමූල්‍යාධිකාරී

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන	10	10a	11	12	13	14	15		
		වැයවූ මූලධන ආධාර	ඉඩම සඳහා ගෙවීම්	වැයනොවූ මූලධන ආධාර	පොදු සංචිතය	පරිත්‍යාග	මුදල් නොවන රජයේ ආධාර	එක්රැස්වූ අරමුදල	ශේෂ අතිරික්තය	මුළු මුදල
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය		26,677,109	61,343,447	2,544,582	(16,355,724)	4,093,286	7,250,000	19,814,137		105,366,837
මූල්‍ය ප්‍රගති ප්‍රකාශන වල සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු					123,614					123,614
මාරු කිරීම් / ශුද්ධ චලනයන්		3,046,813	10,297,372	4,479,698				1,050,840		18,874,723
කාල සීමාව තුල අතිරික්තය / ඌනතාවය					2,698,268					2,698,268
ක්‍රමක්ෂය		(8,034,441)								(8,034,441)
2016.12.31දිනට ශේෂය		**21,689,481**	**71,640,819**	**7,024,280**	**(13,533,842)**	**4,093,286**	**7,250,000**	**20,864,977**		**119,029,001**
දේපල ප්‍රත්‍යාගනනයෙන් පසු අතිරික්තය / ඌනතාවය										0
මාරුකිරීම් ශුද්ධ චලනයන්		10,022,438,149	0	4,500,934				1,406,466		10,028,345,549
මූල්‍ය ප්‍රගති ප්‍රකාශනයන්හි සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු					674,805				7,459,593	8,134,398
ක්‍රමක්ෂය		(7,142,998)								(7,142,998)
අදාල කාලය සඳහා අතිරික්තය / ඌනතාවය					(42,448,648)					(42,448,648)
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,036,984,632**	**71,640,819**	**11,525,214**	**(55,307,685)**	**4,093,286**	**7,250,000**	**22,271,443**	**7,459,593**	**10,105,917,302**

අක / එස්.පී.ඩී පීරිස් මිය /ජ්‍යෝෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සටහන

මෙහෙයුම් ක්‍රියාකාරීත්වයන් තුල මුදල් ප්‍රවාහයන්	සටහන්		2016		2017
		රුපි	රුපි	රුපි	රුපි
අතිරික්තය / ඌනතාවය සාමාන්‍ය ක්‍රියාකාරීත්වය තුලින්		2,698,268		(42,448,648)	
මුදල් නොවන සංචලනය					
ක්ෂය වීම්		8,034,439		6,897,170	
ක්‍රමක්ෂය		(8,034,439)		(7,142,998)	
අතිරික්තය / (ඌනතාවය) පාරිතෝෂික වෙන්කිරීම්		4,542,001		3,223,700	
වෙනත් ගැලපීම්	**25**	123,614		627,819	
වත්කම් ඉවත්කිරීමේදී ලත් ලාභය		(203,900)		0	
අතිරික්තය / (ඌනතාවය) කාරක ප්‍රාග්ධනය					
(ඌනතාවය / අතිරික්තය) ලැබීම්	**26**	(372,658)		(3,153,998)	
අතිරික්තය / (ඌනතාවය) අත්හිටවූ ආදායම		22,594		2,948,789	
අතිරික්තය / (ඌනතාවය) ගෙවීම්	**27**	4,313,215		6,930,751	
(ඌනතාවය) / අතිරික්තය උපචිත වියදම්		1,030,177		15,493,059	
මෙහෙයුම් ක්‍රියාවන් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය			12,153,311		(16,624,356)
ආයෝජන මුදල් ප්‍රවාහය					
යාන්ත්‍රෝපකරන සහ උපකරණ මිලදී ගැනීම් (උපලේඛන ඕ සහ ඊ)		(3,042,087)		(1,266,111)	
ඉඩම් සඳහා ගෙවීම් (ප්‍රාග්ධන)		0			
වෙනත් ව්‍යාපෘති සඳහා ගෙවීම්		(478,215)		(232,955)	
වත්කම් විකිනීම		206,450		0	
ආයෝජන වැඩිකිරීම					
ආයෝජන ක්‍රියා තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය			(3,313,852)		(1,499,066)
මූල්‍යමය ක්‍රියාකාරකම් තුල මුදල් ප්‍රවාහය					
මූලධන ආධාර	**11**	8,000,000		6,000,000	
අතිරික්තය / ඌනතාවය විශේෂිත අරමුදල්		1,050,840		1,406,466	
අතිරික්තය / ඌනතාවය ආධාර		0		0	
මූල්‍ය කටයුතු තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය			9,050,840		7,406,466
ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) මුදල් සහ මුදල් සමතාව			17,890,299s		(10,716,956)
අදාල කාලය ආරම්භයේ මුදල් සහ මුදල් සමතාව			21,542,295		39,432,594
අදාල කාලය අවසානයේ මුදල් සහ මුදල් සමතාව	**28**		39,432,594		28,715,638

අක / එස්.පී.ඩී පීරිස් මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

20. මුදල් ප්‍රකාශයන් පිළිබඳ සටහන්

1. <u>වාර්තාවක සමානතාවය</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය 2000 අංක 03 දරන පනතේ සහ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 ඒ ඡේදය යටතේ ස්ථාපිත වූවකි.

2. <u>වැදගත් වන ගිණුම් ප්‍රතිපත්ති සහ ක්‍රමවේද</u>

2.1 <u>සකස් කරන පදනම</u>

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල පනතින් සංශෝධනය වූ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 10 බී (11)(2) සහ බී කොටස් අනුව සහ 1971 අංක 38 දරන පනතේ 8(3) සහ (12) දරන පරිච්ඡේදයන් මුදල් ප්‍රකාශන ආයතනයේ මූල්‍ය පරිපාලන අංශය මගින් සකස් ලදි.

එකතු වන පදනම හා ඉදිරියට ගෙන යන පදනම මත මූල්‍ය සටහන් පිළියෙල කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත හා පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති ක්‍රමවේද සහ ආකෘතිය අනුවද රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පී.ඊ.ඩී./54 හා 2010 ජනවාරි 19 හා 03/2013 අනුව ද 2014.04.24 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2014 අනුව සකස් කර ඇත.

2009 සහ 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරන ආයතනය මගින් ප්‍රකාශයට පත් කරන ලද පහත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අනුව ගිණුම් සටහන් ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 - ගිණුම් සටහන් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 - මුදල් ප්‍රවාහ සටහන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 - ගිණුම් ප්‍රතිපත්ති ගිණුම් ඇස්තමේන්තු වෙනස්කම් සහ වැරදි.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 - දේපළ,යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 - වෙන් කිරීම්,සාධක මත රඳවා පවතින බැරකම් සහ වත්කම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 - භාණ්ඩ ලේඛන

පහත දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති ගිණුම් සටහන් පිළියෙළ කිරිමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී අඛණ්ඩව ම අනුගමනය කර ඇත.

03 - <u>මුදල් තත්වය දැක්වෙන සටහන් පිළිබඳ සටහන්</u>

මුදල් තත්වය දැක්වෙන සටහන යටතේ 2017.12.31 දිනට පහත සඳහන් අයිතමයන් ඉදිරිපත් කර ඇත.

(අ) <u>පුනරාවර්තන වත්කම්</u>

සටහන 1,2 සහ 3 උපලේඛණ අ,ආ සහ ඇ යටතේ පුනරාවර්තන වත්කම් වර්ගීකරණය කර ඇත.

- ඒ - බැංකුවේ ඇති මුදල් සටහන 1 යටතේ පෙන්නුම් කර ඇත. මෙහි 2017.12.31 දිනට පුනරාවර්තන මුදල් ශේෂය රුපියල් මිලියන 3.0 සහ මූලධන මුදල් ශේෂය රුපියල් මිලියන 6.5කි.
- බී - සටහන 2 යටතේ පෙන්වා ඇති ලැබිම් සාධාරණ වටිනාකමක් අනුව පෙන්වා ඇති අතර එය පදනම් වී ඇත්තේ වාර්ථා කරන දිනට ලැබීමට ඇති ප්‍රමාණයන් අනුවය. ලැබීම් රුපියල් මිලියන 1.9 කින් වැඩි වී ඇත. ණය සහ අත්තිකාරම් ඇතුලුව ලැබීම් වල වටිනාකම රු.13,094,194 කි. ආයෝජන සඳහා වූ පොළී ලැබීම් සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩළය සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ආරක්ෂක තැන්පත් මුදල් ය.

2017 වර්ෂය තුල දී බැඳුම්කර හා ගිවිසුම් ලෙස අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ස්වකීය තනතුර හැර ගිය සාමාජිකයෙකුගෙන් රු.3,816,110.43ක් ලැබීමට ඇත.

- සී - අදාල කාල පරිච්ඡේදයට ලිපි ද්‍රව්‍ය හා මුද්‍රිත කඩදාසි තොගය, තොගය ලෙස සමන්විත විය. එය සිදු කර ඇත්තේ අඩුම මිලට සහ ශුද්ධ ලැබිය හැකි මිලට සහ පළමුව ලබා ගත් තොගය පළමුව උපයෝගී කරනු ලබන පදනම මතය.
  තොග පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂකතුමිය විසින් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ වාර්තාව අදාල නිරීක්ෂණ සමග අධ්‍යක්ෂකතුමිය වෙත භාර දී ඇත. 2017.12.31 දිනට තොගයේ වටිනාකම රු.1,812,967.28 කි.

- ඩී - <u>පෙර ගෙවීම්</u>
  පෙර ගෙවීම් වල යන්ත්‍ර සූත්‍ර සහ වාහනවල නඩත්තු වියදම් ඇතුලත් වේ.(සේවා ගිවිසුම හා රක්ෂණය) 2017 වසර අවසානයේ පෙර ගෙවීම් වටිනාකම රු. 400,939.92 කි.

(ආ) <u>පුනරාවර්තන නොවන වත්කම්</u>

පුනරාවර්තන නොවන වත්කම් සටහන් 4,5,5අ සහ 6 යටතේ වර්ගීකරණය කර ඇත.

- ඒ - දිගු කාලීන ආයෝජන සටහන 04
  දිගු කාලීන ආයෝජන සටහන 04 යටතේ වර්ගීකරණය කර ඇත.ඔවුන්ගේ මූලික හඳුනාගැනීමෙන් පසුව ආයෝජන සාධාරන වටිනාකමෙන් යුතුව පෙන්වා ඇත.
  ප්‍රාදේශීය සංවර්ධන අරමුදල, කාර්මික අයි.ටී.යූ.එම්. සංවර්ධන අරමුදල, විදුලිය සහ පර්යේෂණ සංවර්ධන අරමුදල යනුවෙන් නව ආයෝජන 04 ක් ආරම්භ කර ඇත. වර්ෂයට අදාල පොළිය ද සහිතව සමහර ආයෝජන වැඩි කර ඇති අතර අනෙක් සියලු ම ආයෝජන පසු ගිය වසරේ මෙන් ම පවතී. 2017.12.31 දිනට ආයෝජනවල මුළු වටිනාකම රු.19,082,110.00 කි.

- බී - දේපල යන්ත්‍ර සහ උපකරණ - සටහන 05 උපලේඛණ ඩී
  - ඉදිකිරීම් ව්‍යාපෘතිය දියගම - සටහන 05 උපලේඛණ ඩී 1
  - දියගම වැඩබිම - සටහන 05 උපලේඛණ ඩී
  - වෙනත් වත්කම් - සටහන 06 උපලේඛණ බී

වර්ෂය තුල ප්‍රධාන වෙනස්කම් තුනක් දේපල යන්ත්‍ර සහ උපකරණ සිදුකර ඇත.

<u>තොග පොත් තුල මාරු කිරීම</u>

සමහර අධ්‍යයන අංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම් මත සහ ආයතනයේ කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත සමහර උපකරණ සහ දැව භාණ්ඩ විශ්වවිද්‍යාලයට මාරු කරන ලදි. මෙම වත්කම්වල මුලු වටිනාකම රු.4,471,458,89 ක් වන අතර ක්ෂය වීම් රු. 3,220,011,32 කි. වෙනස රු. 1,251,447.58 ප්‍රාග්ධන ගිණුම හා ගලපන ලදි.

<u>ප්‍රත්‍යාගණනය</u>

2016 දෙසැම්බර් 31 දිනට පවත්නා වත්කම්වල ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය 2017 නොවැම්බර් 30 දිනට අවසන් විය. වටිනාකම (රු.36,339,624.15) ක්ෂය කිරීම් සඳහා වෙන් කිරීම් (රු.28,973,530.16) සහ ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම (රු.15,071,515.00) වත්කම් ගිණුම් වලට ගලපන ලද අතර , ක්ෂයවීම වෙන් කිරීමේ ගිණුම්වලට සහ ප්‍රත්‍යාගණන ගැලපීම් කරන ලදි. ප්‍රත්‍යාගණන ගැලපීම් ගිණුමේ ශේෂය ප්‍රත්‍යාගණන අතිරික්ත ගිණුමට එනම් 7,459,593.30 මාරු කරන ලදි.

<u>නැවත ස්ථාපනය කෙරෙන සහ සංවර්ධන ව්‍යාපෘතියේ වත්කම් වටිනාකම</u>

නැවත ස්ථාපනය කෙරෙන සහ සංවර්ධන ව්‍යාපෘතියේ වත්කම් ගිණුම්වලට රු.10,022,423,486.07 වටිනා වත්කම් ගැලපීම් කරන ලදි. මෙම ගැලපීමට අනුව මුළු ශුද්ධ වත්කම්වල වටිනාකම 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 10 කින් වැඩි විය.

<u>එකතු වීම්</u>

2017 වර්ෂය තුල ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් මිල රුපියල් මිලියන 1.2 පමණ විය. ආයතනය මෙය පී.පී.ඊ. වල එකතුවීම් ලෙස ප්‍රාග්ධනගත කරන ලදි.

<u>ක්ෂය වීම්</u>

1995 ඔක්තෝබර් 05 දින අංක 649 දරණ කොමිෂන් සභා චක්‍ර ලේඛයට අනුව දේපළ යන්ත්‍ර සහ උපකරණ උපයෝගී ජීව කාලයට අනුව නොවෙනස් සෘජු ක්‍රමයකට අනුව ක්ෂයවීම් කරනු ලැබේ. අනෙක් වත්කම් එම වත්කම්වල පෙර වටිනාකම් අනුව එකත් වූ ක්ෂයවීම් ප්‍රමාණය තීරණය කරනු ඇත.

ගොඩනැගිලි සහ ව්‍යුහය	05%
කාර්යාල රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	20%
දැව භාණ්ඩ	10%
පුස්තකාල පොත් සහ වාර සඟරා	20%
තොරතුරු තාක්ෂණ උපකරණ	20%
උපාධි ලෝගු	20%
යන්ත්‍ර සූත්‍ර	10%
වාහන	20%

2017 වර්ෂය සඳහා ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් ක්ෂය වීම් සඳහා රුපියල් මිලියන 6.8ක් වෙන් කර ඇත.

<u>අවසන් කිරීම</u>

සියළු ම ඇසට නොපෙනෙන වත්කම් සඳහා අවසන් වන අයුරු, අවසන් කිරීම නොවෙනස් සෘජු ක්‍රමයකට වෙන් කරනු ලැබේ.

(ඇ) <u>බැරකම්</u>

පුනරාවර්තන බැරකම් (සටහන 7,8 සහ 9) අනුව සාධාරණ වටිනාකමට අනුව හැඳිනගනු ලැබේ.

- ඒ - සටහන 07 යටතේ ගෙවිය යුතු දෑ වර්ගීකරණය කර ඇත.වර්ෂය තුල දී ගෙවිය යුතු දෑ රුපියල් මිලියන 6.0 කින් වැඩි කර ඇත. 2017.12.31 දිනට ගෙවිය යුතු දෑ වල වටිනාකම රු.12,165,602 කි. නොගෙවන ලද ශිෂ්‍යාධාර, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට ගෙවිය යුතු මහපොළ අත්තිකාරම්, පෙර ලද ශිෂ්‍ය නේවාසික ගාස්තු සහ ගෙවිය යුතු ක්ෂය ගිණුම ගෙවීම් අතර වැඩි වටිනාකමක් පවතී.

(ආ) <u>ලැබීමට ඇති ආදායම - සටහන 08 යටතේ වර්ගීකරණය කර ඇත.</u>

ලැබීමට ඇති ආදායම රුපියල් මිලියන 2.9 කින් වැඩි කර ඇත. වර්ෂය තුල නේවාසික ගාස්තු ලැබීම් රු. මිලියන 2.1 කි. මෙම මුදල නේවාසික අරමුදලක් සඳහා යෙදවීමට තබා ගෙන ඇත. මෙම මුදල නේවාසික නඩත්තු කටයුතු සඳහා ද යොදා ගැනීමට නියමිත ය.

(ඉ) <u>උපචිත වියදම් - සටහන 09 යටතේ වර්ගීකරණය කර ඇත.</u>

මෙය ජලය, විදුලිය සහ ආරක්ෂක කටයුතු, පිරිසිදු කිරීම්, ගිවිසුම්ගත සේවා සඳහා රු. මිලියන 15.5 කින් වැඩි වී ඇත. වර්ෂය තුල දී මහා භාණ්ඩාගාරය විසින් ආයතනයට වෙන් කරන ලද මුදල් මුළුමනින් ම නිදහස් නොකරන ලදි. එනිසා ඉහත සඳහන් බිල්පත් නොවැම්බර් මාසයේ සිට එකතු වී ඇත.

(ඊ) පුනරාවර්තන නොවන බැරකම්

අතීත සිදුවීමක් මත ඇති වන වර්තමාන බැඳීමක් උදෙසා වෙන් කෙරෙන පාරිතෝෂිකය අනාගත වියදමක් ලෙස සැළකිය හැක. පාරිතෝෂිකය ගෙවීම සඳහා වැය කිරීම අවශ්‍ය වන අතර මෙම බැඳීම සඳහා පිළිගත හැකි මුදල් ඇස්තමේන්තුවක් සකස් කර නැත.

එකතු වූ පාරිතෝෂික සඳහා 2017 වර්ෂයට රු.24,782,579ක් ප්‍රතිපාදනය කර ඇත. 2016 වර්ෂයට වඩා මෙම මුදල මිලියන 3.2ක් වැඩි කර ඇත. වර්ෂය තුල දී අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයට රු.4,225,934ක් පාරිතෝෂික මුදල් ලෙස ගෙවා ඇත. පාරිතෝෂික වෙන් කිරීම් වැටුප් සඳහා වූ වැය ශීර්ෂයට එක් කිරීම වර්ෂය තුල සිදු කර ඇත.

(උ) වැය වූ මූලධන ප්‍රතිපාදන - සටහන 10 හා 10 ඒ

ස්ථාවර වත්කම් මිල දී ගැනීම හා පර්යේෂණ දියුණු කිරීම සඳහා වර්ෂය තුල දී රු.1,499,066ක මුදලක් වැය කර ඇත. රු.7,142,997ක මුදලක් වැය වූ මූලධන ආධාර සහ පොදු සංචිතය ගිණුම් දෙක අතර ගැළපීම් කර ඇත්තේ වත්කම් ඇවර කිරීම සඳහා ය. අදාල කාලපරිච්ඡේදය තුල අයි.ටී.යූ.එම්. නැවත ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ වියදම් රු. මිලියන 10.3කින් වැඩි කර ඇත.

(ඌ) වැය නොවූ මූලධන ආධාර - සටහන 01

වැය නොවූ ආධාර රු. මිලියන 4.5 කින් වැඩි කර ඇත. කාර්යාල රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ වැය අඩු උපයෝගීතාවයක් වූයේ බොහෝ උපකරන ලැබුනේ අයි.ටී.යූ.එම්. නැවත ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන හෙයිනි.

(එ) පොදු සංචිතය - සටහන 12

අදාල කාලපරිච්ඡේදය තුල වියදම ආදායමට වැඩි වූයෙන් පොදු සංචිතය රු. මිලියන 41.8කින් වැඩි විය.

(ඒ) මුදල් නොවන රජයේ ආධාර - සටහන 13

මුදල් නොවන රජයේ ආධාර ලෙස 2012 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අංක එන්.බී. 3020 සහ කේ.ඩී.9589 වාහන දෙක සැලකිය හැක.

(ඔ) පරිත්‍යාග - සටහන 14

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා ආදි ශිෂ්‍ය සංගමය විසින් පරිත්‍යාග කරන ලද අංක එන්.ඒ.7806 දරණ වාහනයේ වටිනාකම සහ අනෙක් දේ පරිත්‍යාග ලෙස ඇතුලත් වේ.

(ඕ) එක් රැස් වූ අරමුදල් - සටහන 15

අදාල කාලපරිච්ඡේදය තුල එක් රැස් වූ අරමුදල රු. මිලියන 1.4 කින් වැඩි විය. 2017.12.31 දිනට සම්පූරණ වටිනාකම රු.22,271,443කි. මෙම මුදල් උපලේඛන ජේ සහ කේ යටතේ වර්ගීකරණය කර ඇත.

04. මූල්‍යමය ප්‍රගතිය පිළිබඳ සටහන සඳහා වූ සටහන්

2017 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා ක්‍රියාකාරී ආදායම සහ ක්‍රියාකාරී වියදම වර්ගීකරණය කර ඇත.

එස්.එල්.පී.එස්.ඒ.එස්. යටතේ ආදායම උපචිත ලෙස හඳුනාගෙන ඇත. එනිසා ආදායම අදාල වියදම සමග සංසන්දනාත්මක වීම අවශ්‍ය නොවේ.අදාල කාලය තුල මුදල් ප්‍රවාහයන් ආදායම සහ එයට අනුරූප වියදම් ලෙස සැලකේ.

(අ) මෙහෙයුම් ආදායම

ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් රු.169,854,000ක මුදලක් ලැබී ඇති අතර අදාල කාලපරිච්ඡේදයට වෙනත් ආදායම් ලෙස ලද රු. 6,405,142 ද මූල්‍ය ප්‍රගතිය දැක්වෙන සටහනෙහි පෙන්නුම් කර ඇත. මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 16.2 කින් වැඩි කල ද අදාල වර්ෂය තුල මහා භාණ්ඩාගාරය සම්පූර්ණ මුදල ම නිදහස් නොකරන ලදි. වාර්තා කරන කාලය සඳහා වෙනත් ආදායම් මිලියන 4 කින් වැඩි විය. උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති කාර්යාල වියදම් සඳහා මිලියන 05ක් ලද අතර ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ක්‍රීඩා කටයුතු සඳහා රු.200,000ක් ලැබුණි.

(ආ) මෙහෙයුම් වියදම්

උපචිත ගිණුම් යටතේ වියදම් ආර්ථික වාසි ලෙසත් වාර්තා කෙරෙන කාල සීමාව සඳහා සේවා විභව ශක්තිය පිටත ගලා යාම හෝ වත්කම් ක්ෂය වන පරිදි උපයෝගී කර ගැනීම බැරකම් සිදුකර ගැනීමෙහි ප්‍රතිපලයක් ලෙස ශුද්ධ වත්කම් / අගය ප්‍රතිපලය ලෙස දැක්වේ. වියදම් කරනු ලබන්නේ ගනුදෙනුව හදුනාගැනීමෙන් පසුව හෙයින් එය මුදල් හෝ ඊට සමාන දෙය ලද පසුව වැය නොවනු ඇත.

2017.06.15 දින සහ 2017/13 දරණ කොමිෂන් සභා චක්‍ර ලේඛය අනුව අධ්‍යයන කාර්යය මණ්ඩල අත්තිකාරම් වැඩි වීම හේතුවෙන් පෞද්ගලික පඩිනඩි රු. මිලියන 20.4 කින් වැඩි වී ඇත (සටහන 17). නව වැටුප් සංශෝධනය කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2017.01.01 සිට කළ යුතුව ඇත. වර්ෂය අවසාන භාගයේ දී ආයතනය අනුමත කාර්යය මණ්ඩලයට යටත්ව කාර්යය මණ්ඩල නිළධාරීන් 47ක් බදවා ගනු ලැබීය. කළමණාකරන සහකාර, කාර්මික නිළධාරී, පුස්තකාල තොරතුරු සහකාර, වැඩ සහකරු සහ රසායනාගාර සහකරු බදවා ගනු ලැබීය.2017 මැයි මස නව පරිශ්‍රයේ දී ආයතනය නැවත ස්ථාපනය කිරීම හේතුවෙන් ලිපි ද්‍රව්‍ය ගිවිසුම්ගත සේවා වියදම් ආයතනයෙන් දැරීමට සිදු විය.

හැකියා වර්ධන ගොඩනැගිල්ල සහ පර්යේෂණ සංවර්ධනය සදහා වෙන්වෙන් වශයෙන් ප්‍රතිපාදන රු.26,730ක් සහ රු.206,225 ආදායම් සහ වියදම් යටතේ හදුනාගෙන ඇත.

2016 සඳහා සාමාන්‍ය මෙහෙයුම් වියදම රු.2,494,368 ක අතිරික්තයක් විය. එය 2017 වර්ෂයේ දී රු. 42,448,648ක ඌනතාවයක් විය.

05. මුදල් ප්‍රවාහ සටහන පිළිබඳ සටහන්

මෙහෙයුම් කටයුතුවලින්, ආයෝජන කටයුතුවලින්, මූල්‍යමය කටයුතුවලින් සියළු මුදල් ප්‍රවාහයන් (අභ්‍යන්තර සහ බාහිර) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති එස්.එල්.පී.එස්.ඒ.එස්. – 02 අනුව 2017.12.31 දිනට මුදල් ප්‍රවාහ සටහන් වර්ගීකරණය කර ඇත.

ආයතනය සියලු ස්ථාවර වත්කම් සහ මුදල් පොත්හි ශේෂ මුදල් 2017.12.31 දිනට එහි වටිනාකම ලෙස සලකන ලදි. ඉතිරි මුදල් සහ මුදලට සමාන දෑ රු.28,715,638ක් විය.

අ.ක. / එස්.පී.ඩී.පීරිස්

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී.

- (ගිණුම් සටහන්වලට අදාල සියලු විස්තර ඉංග්‍රීසි පිටපතෙහි දක්වා ඇත)

21. විගණන කමිටු වාර්තාව

<u>අභ්‍යන්තර විගණන වාර්තාව.</u>

විගණන කොමිටිය සහ කළමණාකරණ මණ්ඩලය අනුමත කරන ලද විගණකාධිපතිතුමාගේ එකගත්වය ඇතිව විගණන වැඩ සටහන අනුව විශේෂිත වැඩ කොටස් ආවරනය වන පරිදි මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ විගණන කටයුතු 2016 වර්ෂයේ දී ද පහත සඳහන් පරිදි ඉටු කරන ලදි.

1. <u>පූර්ව විගණනය.</u>

- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම (යූ.පී.එෆ්.)
- පාරිතෝෂික මුදල් ගෙවීම.
- විශ්‍රාම වැටුප් අරමුදලෙන් විශ්‍රාම වැටුප් නිදහස් කිරීම.
- බැඳුම්කර ගණනය කිරීම.

2. <u>හඳුනා ගැනීම් මත විගණන විමසුම් නිකුත් කිරීම.</u>

- ස්ථාවර වත්කම් වල වැරදි නිවැරදි බව පරීක්ෂා කිරීම.
- ගෙවීම් වවුචර නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම - 2017

3. <u>ක්‍රියාත්මක කරන ලද වෙනත් විගණන පරීක්ෂා කිරීම්.</u>

- බැංකු සැසඳුම් පරීක්ෂා කිරීම.
- විවිධ අත්තිකාරම් පරීක්ෂා කිරීම.
- ණය අත්තිකාරම් ගෙවීම් සාම්පල් පරීක්ෂා කිරීම.

4. <u>විගණන කමිටුව</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ විගණන කොමිටුව, ක්‍රියාකාරකම් සමාලෝචනය සඳහා තෙමසකට වරක් රැස් වෙති. විගණකාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන විගණන වාර්තා , විගණන විමසීම් සහ ඒවා පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම් විගණන කොමිටිය විසින් සලකා බලනු ලැබේ.

අදාල වර්ෂය තුල දී විගණන කොමිටුව අවස්ථා හතරක දී රැස් ව ඇත.

5. <u>කාර්ය මණ්ඩලය</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ ක්‍රියාකාරකම් පරීක්ෂා කර බැලීම සඳහා මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ විගණන කොමිටුව තෙමසකට වරක් විධිමත්ව රැස් වේ.මෙම කොමිටුව විගණන වාර්තා මෙන් ම විගණකාධිපති විසින් එවනු ලබන විගණන විමසීම් ද සලකා බලනු ලබයි.එමෙන් ම නිවැරදි කිරීම් පිණිස එවනු ලබන උපදෙස් පිළිබඳ නිතර විමසිලිමත් වේ.

වර්ෂයට අදාල කාලය තුල විගණන කොමිටුව අවස්ථා හතරක දී ක්‍රියා කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

Institute of Technology University of Moratuwa 19 OCT 2018

මගේ අංකය / எனது இல. / My No. } එච්ආර්/ඊ/අයිටීයූඑම්/6/17/එෆ්ජ්
මබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 15 දින

අධ්‍යක්ෂ,

තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය.

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ III වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) ප්‍රමිතයේ 09 ඡේදය අනුව "ආයෝජනයක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස සුදුසුකම් ලබනුයේ, එය අත්පත් කරගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කෙටි කල්පිරීම් කාලයක් පවතින අවස්ථාවලදී පමණක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට රු.19,082,110 ක් වූ දිගුකාලීන ආයෝජන ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ තුළ ඇතුළත් කර තිබුණි. මෙම ක්‍රමවේදයම පූර්ව වර්ෂයේදීද අනුගමනය කර තිබුණ අතර එය සමාලෝචිත වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණද ඊ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දෑ හි වැඩිවීම රු.6,906,266 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.6,930,751 ක වැඩිවීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.834,485 ක වෙනසක් නිරීක්ෂණය විය.

3

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 65 වන වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.19,046,962 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාළ මහපොළ හා ශිෂ්‍යාධාර වියදම පිළිවෙලින් රු.4,150,150 ක් හා රු.18,640,900 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වියදම පිළිවෙලින් රු.4,910,000 ක් හා රු.17,897,100 ක් ලෙස දැක්වීම හේතුවෙන් මහපොළ රු.759,850 ක් වැඩියෙන් හා ශිෂ්‍යාධාර රු.743,800 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) 2017 නොවැම්බර් 30 දින කාර්යාල, විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ රු.14,427,810 කට හා ලී බඩු රු.643,705 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර නව ප්‍රත්‍යාගණන අගයයන් මත 2017 දෙසැම්බර් 31 දිනට රු.245,828 ක් වූ ක්ෂය , ක්ෂය ගිණුමෙන් ඉවත් කර ප්‍රත්‍යාගණන ගැලපුම් ගිණුමට හර කර තිබුණි. ඒ අනුව එම වත්කම්වලට අදාල ක්ෂය වටිනාකම හා ප්‍රත්‍යාගණන සංචිතය රු.245,825 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කාර්යාල , විද්‍යාගාර, ඉගැන්වීම් උපකරණ සහ ලී බඩු යන වත්කම් ඉවත් කිරීමේ අලාභය වූ රු.1,251,448 මෙහෙයුම් වියදමක් ලෙස ලාභයෙන් අඩුකර දැක්විය යුතු වුවද එම අලාභය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ගලපා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපණය වී තිබුණු අතර වර්ෂාවසාන ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

4

(ඇ) ආයතනයේ ව්‍යපෘති භූමියේ විදුලි සැපයුම වෙනුවෙන් වැයකර තිබූ රු.1.,407, 000 ක් ගොඩනැගිලි වටිනාකමට ප්‍රාග්ධනීකරණය කිරීම වෙනුවට පුනරාවර්තන වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි .

(ඉ) දියගම තාක්ෂණික ආයතනයේ ප්‍රතිස්ථාපන සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය තුළ දරා තිබුණු රු.10,360,051 ක වියදම,කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

2.2.4 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ආයතනය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපැලක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 45 (2) (1) (XV) ප්‍රකාරව විශ්වවිද්‍යාලයට අයත් කවර මුදලක් වුවද නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කළ යුතු බව දක්වා තිබුණද දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන (Distance Education Modernization Programme) වෙනුවෙන් 2009 වර්ෂයේදී වෙන්කරන ලද රු.955,030 ක මුදලක් කිසිදු ආයෝජන කටයුත්තකට යොදා ගැනීමකින් තොරව තාක්ෂණික ආයතනයේ ජංගම ගිණුමෙහි රදවාගෙන තිබුණි.

5

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බැර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.42,448,648 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,494,368 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 44,943,016 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු.16,254,000 කින් වැඩිවී තිබුණද ඊට සාපේක්ෂව පුනරාවර්තන වියදම් රු.69,767,960 කින් වැඩිවීම ඉහත පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.3,510,686 ක් වූ ඌනතාවය තව දුරටත් පිරිහී 2017 වර්ෂයේදී රු.42,448,648 ක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.60,21,335 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.104,481,868 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුළ පවත්වන ලද ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන වසර විභාග ප්‍රතිඵල මත අධ්‍යයන අංශ 09 ක සිසුන්ගේ සමත්වීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 83 ක් වුවද, Electronic, Marine, Polymer , Civil , Mechanical සහ Textile යන අංශවල සමත්වීමේ ප්‍රතිශතය පිළිවෙලින් 65,72,76,76,78 සහ 79 ක් විය. ඒ අනුව එම අංශවල විභාග ප්‍රතිඵල අපේක්ෂිත මට්ටම කරා ළඟා වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ජාතික තාක්ෂණික ඩිප්ලෝමාවට නව පාඨමාලා හඳුන්වා දීමට සැලසුම් සකස් කර තිබුණද 2018 අගෝස්තු 09 දින වනවිටත් එම පාඨමාලාවන් සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි.

6

(ඇ) 2015, 2016 සහ 2017 වර්ෂයන්හිදී ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.100,000 ක්, රු.100,000 ක් සහ රු.1,000,000 ක් බැගින් වූ ප්‍රතිපාදන වෙන් කර තිබුණද එයින් කිසිදු මුදලක් වැයකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය සඳහා කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 9,096,878 ක් වූ අරමුදල් 06 ක් එම අරමුදල් ස්ථාපිත කළ දින සිට වසර 09 සිට 14 ක් දක්වා කාලයක සිට කිසිදු කාර්යයක් සඳහා යොදා ගැනීමකින් තොරව අක්‍රීයව පැවතුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලය 111 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 38 ක් වූයෙන් පුරප්පාඩු 73 ක් විය. එම පුරප්පාඩු පිරවීම සඳහා බාහිර තාවකාලික හා වැඩ පැවරුම් පදනම මත 45 දෙනෙකු බඳවා ගෙන තිබුණද තවදුරටත් තනතුරු 28 ක් පුරප්පාඩුව පැවතුණි. අනුමත අනධ්‍යයන කාර්යමණ්ඩලය 156 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 76 ක් වූයෙන් පුරප්පාඩු 80 ක් විය. එම පුරප්පාඩු පිරවීම සඳහා බාහිර, තාවකාලික හා වැඩ පැවරුම් පදනම මත 20 දෙනෙකු බඳවා ගෙන තිබුණද තවදුරටත් තනතුරු 60 ක් පුරප්පාඩුව පැවතුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

7

6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින ඉදිරිපත් කර තිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව කටයුතු නොකිරීම.
(ආ)	ස්ථාවර වත්කම් පාලනය	ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබීම.
(ඇ)	අරමුදල් කළමනාකරණය	අරමුදල් ඇති කිරීමේ අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියා නොකිරීම.
(ඈ)	කාර්යමණ්ඩල පරිපාලනය	පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුනොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

8

විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්ථාවට පිළිතුරු.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.	**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**
2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.	**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.**
(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02.** (i) ප්‍රමිතයේ 09 ජේදය අනුව ආයෝජනයක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස සුදුසුනම් ලබන්නේ, එය අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කෙටි කල් පිරීම් කාලයක් පවතින අවස්ථාවලදී පමණක් වුව ද 2017 දෙසැම්බර් 31 දිනට රු.19,082,110 ක් වූ දිගු කාලීන ආයෝජන ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ තුල ඇතුලත් කර තිබුණි. මෙම ක්‍රමවේදයම පූර්ව වර්ශයේ දී ද අනුගමනය කර තිබූ අතර එය සමාලෝචිත වර්ෂය තුල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි . (ii) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දැහි වැඩී වීම රු. 6,906,266ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රුග 6,930,751 ක වැඩි වීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 834,485 ක වෙනසක් නිරීක්ෂණය විය. (ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07** ප්‍රමිතයේ 65 වන වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 19,046,962 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි	(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02.** (i) / (ii) 2017 වසරේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් සිදුකොට 2018 වසරේ ගිණුම් සමග ඉදිරිපත් කිරීමට සටහන් තබා ගන්නා ලදි. (ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07** ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය අවසන් වීමෙන් පසු තව දුරටත් ප්‍රයෝජනයට ගනු ලබන ස්ථාවර වත්කම්වල වටිනාකම ප්‍රත්‍යාගණන කර 2018 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ගිණුම් වාර්ථාවල ඇතුලත් කිරීමට පියවර ගැනීමට සටහන් තබා ගන්නා ලදි.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
2.2.3 ගිණුම්කරණ අඩුපාඩු	**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**
(අ) විගණනයට ඉදිරිපත් කරන තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාල මහපොළ හා ශිෂ්‍යාධාර වියදම් පිළිවෙලින් රු.4,150,150 ක් හා රු. 18,640,900 ක් වුව ද මූල්‍ය ප්‍රකාශනවල එම වියදම පිළිවෙලින් රු. 4,910,000 හා රු. 17,897,100 ලෙස දැක්වීම හේතුවෙන් මහපොළ රු. 759,850ක් වැඩියෙන් හා ශිෂ්‍යාධාර රු. 743,800ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	**(අ)** මහපොල හා ශිෂ්‍යාධාර සඳහා වර්ෂයට අදාලව ගෙවීම් කල මුදලට සමාන මුදලක් එම ලැබීම් වශයෙන් ආදායම් වියදම් ප්‍රකාශයේ සටහන් කරයි. ඊට හේතුව වන්නේ එම වසරට අදාලව ඊලග වර්ෂය මුලදී ම මහපොළ හා ශිෂ්‍යාධාර වශයෙන් ගෙවීම් කිරීමට වාරිකයක් හෝ දෙකක් ඉතිරි වන බැවිනි. අමුණා ඇති විස්තරාත්මක සටහන මේ සමග ඉදිරිපත් කරමි. **(ඇමුණුම I)** එහි සඳහන් මහපොළ වශයෙන් රු.648,900.00ක හා ශිෂ්‍යාධාර වශයෙන් රු.4,605,100.00ක මුදල එලඹෙන වසරේ ඉක්බිතිව ගෙවීම් කටයුතු සිදු කරනු ඇත.
(ආ) 2017 නොවැම්බර් 30 දින කාර්යාල, විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ රු. 14,427,810කට හා ලී බඩු රු. 643,705 කට ප්‍රත්‍යාගණනය කර තිබූ අතර නව ප්‍රත්‍යාගණන අගයන් මත 2017 දෙසැම්බර් 31 දිනට රු.245,828ක් ක්ෂය, ක්ෂය ගිණුමෙන් ඉවත් කර ප්‍රත්‍යාගණන ගැලපුම් ගිණුමට හර කර තිබුණි. ඒ අනුව එම වත්කම්වලට අදාල ක්ෂය වටිනාකම හා ප්‍රත්‍යාගණන සංචිතය රු. 245,825කින් අඩුවෙන් දක්වා තිබුණි.	(ආ)මෙම රු. 245,825.00 ක අගයන් පරීක්ෂා කර බලා 2018 වාර්ෂික ගිණුම් සැකසීමේ දී අදාල ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත.
(ඇ) කාර්යාල, විද්‍යාගාර, ඉගැන්වීම් උපකරණ හා ලී බඩු යන වත්කම් ඉවත් කිරීමේ අලාභය වූ රු. 1,251,448 මෙහෙයුම් වියදමක් ලෙස ලාභයෙන් අඩු කර දැක්විය යුතු වුව ද එම අලාභය ප්‍රාග්ධන ප්‍රධාන ගිණුමට ගලපා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපණය වී තිබූ අතර වර්ෂාවසාන ප්‍රාග්ධන ප්‍රධාන ශේෂය ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	(ඇ) මෙහි දක්වා ඇති ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ දී පැන නැගී ඇති අලාභය පිළිබඳ ගැලපීම් සිදු කර 2018 වර්ෂයේ දී ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ගිණුම් වාර්තා සමග ගැලපීම් කටයුතු කරනු ඇත.
(ඈ) ආයතනයේ ව්‍යාපෘති භූමියේ විදුලි සැපයුම වෙනුවෙන් වැය කර තිබූ රු. 1,407,000ක් ගොඩනැගිලි වටිනාකමට ප්‍රාග්ධනිත කිරීම වෙනුවට පුනරාවර්තනව වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	(ඈ) ඉහත දක්වා ඇති රු.1,407,000.00 ක මුදල පිළිබඳ පරීක්ෂා කර බලා අදාල ගැලපීම් සිදු කර 2018 වර්ෂයේ දී ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ගිණුම් වාර්ථා සමග ඉදිරිපත් කරනු ඇත.
(ඉ) දියගම තාක්ෂණික ආයතනයේ ප්‍රතිස්ථාපනය සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය තුල දරා තිබුණ රු.10,360,051 ක වියදම , කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.	(ඉ) අදාල ගැලපීම් සිදු කිරීමට සටහන් තබා ගන්නා ලදි.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
2.2.4 ආයතනය විසින් ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි	**2.2.4 ආයතනය විසින් ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**
ආයතනය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු. මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර තිබුණි.මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශණවල හෙළිදරව් කර නොතිබුණි.	නෛතික සිද්ධි සම්බන්ධයෙන් ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් වාර්ථා ඉදිරිපත් කිරීමේදී ඒ සටහන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
2.3 නීති, රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම	**2.3 නීති, රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම.**
1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 45 (2) (1) (xv) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයට අයත් කවර මුදලක් වුව ද නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කළ යුතු බව දන්වා තිබුණ ද දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන (Distance Education Modernization Programme) වෙනුවෙන් 2009 වර්ෂයේ දී වෙන් කරන ලද රු.955,030 ක මුදලක් කිසිදු ආයෝජන කටයුත්තකට යොදා ගැනීමෙන් තොරව තාක්ෂණික ආයතනයේ ජංගම ගිණුමෙහි රඳවාගෙන තිබුණි.	විශ්වවිද්‍යාල පනතේ අංක 45(2) (1) (xv) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයට අයත් අරමුදල් නීත්‍යානුකූලව ආයෝජනය කරනු ලබන අතර කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති රාජ්‍ය බැංකුවක් වන ලංකා බැංකුවෙහි ස්ථිර තැම්පතු මුදලක් ලෙස එම අරමුදල් තැන්පත් කිරීම 20114.01.10 දින සිදු කර ඇත. නමුත් එහි ඇති වූ වියදම් වෙනුවෙන් මෙම ස්ථාවර තැන්පතුව මුදල් කිරීමට සිදු වූ අතර එහි ඉතිරි වී ඇති වියදම් දැරීමෙන් පසුව ඉතුරු වන යම් මුදලක් ඇතොත් එය අරමුදල් ගිණුමක තැන්පත් කිරීමට සැලසුම් කර ඇත.
3. මූල්‍ය සමාලෝචනය	**3. මූල්‍ය සමාලෝචනය.**
3.1 මූල්‍ය ප්‍රතිඵල.	**3.1 මූල්‍ය ප්‍රතිඵල.**
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, **2017** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.42,448,648 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,494,368 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 44,943,016 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පසු ගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රජයේ ප්‍රදාන රු.16,254,000 කින් වැඩි වී තිබුණ ද ඊට සාපේක්ෂව පුනරාවර්තන වියදම් රු.69,767,960 කින් වැඩි වීම ඉහත පිරිහීමට හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේදී රු.3,510,686 ක ඌනතාවය තව දුරටත් පිරිහී 2017 වර්ෂය වන විට රු.42,448,648 ක් බවට පත් වී තිබුණි.කෙසේ වුව ද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, හා දේපල පිරියත උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ දී රු.6,021.335 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු. 104,481,868 දක්වා වර්ධනය වී තිබුණි.	එකඟ වෙමි

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
4.මෙහෙයුම් සමාලෝචනය.	**4.මෙහෙයුම් සමාලෝචනය.**
4.1 කාර්යසාධනය	**4.1 කාර්යසාධනය**
4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය.	**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය.**
පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ. (අ) 2017 වර්ෂය තුල පවත්වන ලද ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන වසර විභාග ප්‍රතිඵල මත අධ්‍යයන අංශ 09 ක සිසුන්ගේ සමත්වීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 83ක් වුව ද Electronic, Marine, Polymer, Civil, Mechanical සහTextile යන අංශවල සමත් වීමේ ප්‍රතිශතය පිළිවෙලින් 65,72,76,76,78 සහ 79 ක් විය. ඒ අනුව එම අංශවල විභාග ප්‍රතිඵල අපේක්ෂිත මට්ටම කරා ලගා වී නොතිබුණි. (ආ)සමාලෝචිත වර්ෂයේ දී ජාතික තාක්ෂණ ඩිප්ලෝමාවට නව පාඨමාලා හදුන්වා දීමට සැලසුම් සකස් කර තිබුණ ද 2018 අගෝස්තු 09 වන විටත් එම පාඨමාලාවන් සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි.	(අ) පාඨමාලාව හදාරන සිසුන් වැඩි ප්‍රමාණයක් සමත් වීම ආයතනයේ අපේක්ෂාව වුවද විවිධ හේතූන් මත එම සංඛ්‍යාව අපේක්ෂිත මට්ටමට වඩා පහළ යාම සිදු වේ. පාඨමාලාවේ ගුණාත්මක තත්වයද පවත්වා ගනිමින් සිසුන් සමත් වීමේ ප්‍රතිශතය ද ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු වී ඇත. (ආ)තොරතුරු තාක්ෂණය සඳහා වන පාඨමාලාවේ විෂය නිර්දේශය නිම කර ඉදිරිපත් කර පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදි. මෙය දීර්ඝ කාලයක් ගත වන ක්‍රියාවලියක් වන අතර මේ අනුව 2019 සඳහා අලුත් ශිෂ්‍ය කණ්ඩායමක් බඳවා ගැනීමට 2018 ජූලි මාසයේ දී දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා ඇත.
(ඇ) 2015,2016 සහ 2017 වර්ෂයන්හි දී ක්‍රීඩා භාණ්ඩ මිල දී ගැනීම සඳහා පිළිවෙලින් රු.100,000, රු.100,000 හා රු.100,000ක් බැගින් වූ ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද ඉන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි. (ඈ) සමාලෝචිත වර්ෂයේ දී ආයතනය සඳහා කාර්යක්ෂම හා ඵලදායී කළමණාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.	(ඇ)සිසුන්ගේ ක්‍රීඩා කටයුතු සඳහා මොරටුව විශ්වවිද්‍යාලයීය ක්‍රීඩාගාරය හා ක්රීඩා භාණ්ඩ භාවිතා කරන අතර අමතර ක්‍රීඩා භාණ්ඩ මිල දී ගැනීම සඳහා සැලසුම් කර තිබුණද ඒ සඳහා ඉල්ලීමක් නොමැතිවීම හේතුවෙන් මෙසේ මිල දී ගැනීම් සිදු නොවුණි. (ඈ) ආයතනය සඳහා කාර්යක්ෂම හා ඵලදායී කළමණාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට සැලසුම් කර මූලික කටයුතු සිදු කරමින් පවතින අතර ඒ සඳහා අපේක්ෂිත තත්වය ළගා කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම බලාපොරොත්තු වනු ඇත.
4.2 අරමුදල් ඌන උපයෝජනය	**4.2 අරමුදල් ඌන උපයෝජනය**
2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.9,096,878 ක් වූ අරමුදල් 06ක් එම අරමුදල් ස්ථාපිත කළ දින සිට වසර 09 සිට 14 ක් දක්වා කාලයක සිට කිසිදු කාර්යයක් සඳහා යොදා ගැනීමකින් තොරව අක්‍රීයව පැවතුණි.	මෙම අරමුදල් ස්ථාවර තැම්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. එමගින් ලැබෙන පොළී මුදල්වලින් අදාල අංශවල සංවර්ධන කටයුතු කිරීමට පියවර ගනු ඇත.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
4.3 කාර්ය මණ්ඩල පරිපාලනය	**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**
අනුමත අධ්‍යයන කාර්යය මණ්ඩලය 111 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 38 ක් වූයෙන් පුරප්පාඩු 37 ක් විය. එම පුරප්පාඩු පිරවීම සඳහා බාහිර තාවකාලික හා වැඩ පැවරුම් මත 45 දෙනෙකු බඳවාගෙන තිබුණ ද තවදුරටත් තනතුරු 28 ක් පුරප්පාඩුව පැවතුණි. අනුමත අධ්‍යයන කාර්යය මණ්ඩලය 156 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 76 ක් වූයෙන් පුරප්පාඩු 80 ක් විය. එම පුරප්පාඩු පිරවීම සඳහා බාහිර තාවකාලික හා වැඩ පැවරුම් මත 20 දෙනෙකු බඳවාගෙන තිබුණ ද තවදුරටත් තනතුරු 60 ක් පුරප්පාඩුව පැවතුණි.	**අනුමත අධ්‍යයන කාර්යය මණ්ඩලය** කථිකාචාර්ය - 53 තාවකාලික ප්‍රදර්ශක - 36 සහකාර පුස්තකාලයාධිපති - 01 **එකතුව 90** 2017.12.31 වන දිනට කථිකාචාර්යවරුන් 35 ක් ද තාවකාලික ප්‍රදර්ශකවරුන් සඳහා වන අනුමත කාර්යය මණ්ඩලය යටතේ තාවකාලික උපදේශකවරුන් 29 ක් ද සේවය කළ අතර විවිධ අංශයන්හි කථිකාචාර්ය පුරප්පාඩු 13 ක් පිරවීමට 2017.10.01 දින පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවන ලදි. පසුව මෙම පුරප්පාඩුවලින් කොටසක් පුරවා ඇත. අනුමත අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 19 ක් පිරවීමට 2017.11.09 දින පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවන ලද අතර ඒ අනුව තනතුරු 19 ක් පුරවා ඇත. මීට අමතරව විගණන සහකාර හා රියදුරු තනතුරු ද අභ්‍යන්තර අයදුම්පත් මගින් සුදුස්සන් තෝරා පිරවීමට කටයුතු කරන ලදි. අධ්‍යයන නොවන කාර්යය මණ්ඩලයේ තනතුරු 20 ක් සඳහා වැඩ පැවරුම් හා තාවකාලික පදනම මත 20 දෙනෙකු සේවයේ යොදවා ආයතනික කටයුතු බාධාවකින් තොරව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.ඉතිරි පුරප්පාඩු කිහිපයක් ස්ථාන මාරුවීම් පදනම මත පිරවීමට කටයුතු කරමින් සිටී.
5. තිරසාර සංවර්ධනය	**5. තිරසාර සංවර්ධනය**
5.1 තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම	**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම**
තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.	තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ වන අධ්‍යාපනය වෙත ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන නව පාඨමාලා ක්ෂේත්‍රයන් හඳුන්වාදීම සඳහා කටයුතු කරගෙන යනු ලබන අතර 2019 වසර සඳහා සිසුන් 100 කගෙන් යුතු ව ˜තොරතුරු තාක්ෂණය˜ විෂය ක්ෂේත්‍රය ඇරඹීමට කටයුතු යොදා ඇත.අවශ්‍ය පරිදි අනිකුත් අරමුණු කරා ලගා වීම සඳහා ද ඉදිරියේ දී කටයුතු සිදු කෙරෙනු ඇත
6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය	6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම	6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
2003 ජූනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින ඉදිරිපත් කර තිබුණි.	විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවක වැඩ වර්ජනය 2018 පෙබරවාරි 28 ආරම්භ වූ බැවින් හා මාර්තු මස 01 දින පොහොය නිවාඩු දිනයක් බැවින් මාර්තු 02 දින විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි.

<table>
<tr><th>විගනන මතය</th><th>පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>7. පද්ධති හා පාලනයන්</td><td>7. පද්ධති හා පාලනයන්</td></tr>
<tr><td>විගණනයේදී නිරික්ෂනය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සදහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

<table>
<tr><th>පද්ධති හා පාලන ක්ෂේත්‍ර</th><th>නිරික්ෂණ</th></tr>
<tr><td>(අ) ගිණුම්කරණය</td><td>රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව කටයුතු නොකිරීම.</td></tr>
<tr><td>(ආ) ස්ථාවර වත්කම් පාලනය</td><td>ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබීම.</td></tr>
<tr><td>(ඇ)අරමුදල් කළමනාකරණය</td><td>අරමුදල් ඇති කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට ක්‍රියා නොතිබීම</td></tr>
<tr><td>(ඈ) කාර්යය මණ්ඩල පරිපාලනය</td><td>පුරප්පාඩු තනතුරු සදහා බදවා ගැනීම් සිදු නොකිරීම.</td></tr>
</table></td>
<td>(අ)රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව හැකිතාක් දුරට කටයුතු කර ඇත.

ආ) මෙහි දී ආයතනය මිල දී ගන්නා ලද වත්කම් ස්ථාවර වත්කම් ලේඛණයේ යාවත්කාලීන කිරීම් කර ඇති අතර ව්‍යාපෘතියේ මිල දී ගැනීම් සම්බන්ධව යාවත්කාලීන කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අරමුදල් කළමනාකරණය පිළිබද විශේෂ අවධානය යොමු කරනු ඇත.

(ඈ) 2018 වර්ෂයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල බදවා ගැනීම් සිදු කෙරෙමින් පවතී.</td></tr>
</table>

ඇමුණුම I – 2.2.3

මහපොළ

පසුගිය වර්ෂයේ ශේෂය		රු.1,408,750.00
<u>එකතු කළා</u>		
2017 ලද මුදල් (වි.වි.ප්‍ර.කො.සභාව හා මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදල)		රු.6,152,750.00
		රු.7,561,500.00
<u>අඩු කළා</u>		
2017 වර්ෂයේ ගෙවීම්	රු.4,910,000.00	
වි.වි.ප්‍ර.කො.සභාව වෙත ගෙවිය යුතු මුදල	රු.2,002,600.00	රු.6,912,600.00
ශේෂය		රු. 648,900.00

ශිෂ්‍යාධාර

පසුගිය වර්ෂයේ ශේෂය	රු. 3,861,300.00
<u>එකතු කළා</u>	
2017 ලද මුදල් (වි.වි.ප්‍ර.කො.සභාව)	රු.18,640,900.00
	රු.22,502,200.00
<u>අඩු කළා</u>	
2017 වර්ෂයේ ගෙවීම්	රු.17,897,100.00
ශේෂය	රු.4,605,100.00

අ/ක එම්.එම්.පි.ඩී සමරසේකර

අධ්‍යක්ෂ

තාක්ෂණික ආයතනය

මොරටුව විශ්වවිද්‍යාලය.